ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව

# 2013

# පටුන

විශ්වවිද්‍යායේ නිල ලාංඡනය....7
විශ්වවිද්‍යාලයේ දැක්ම....7
විශ්වවිද්‍යාලයේ මෙහෙවර....7
**උපකුලපතිගේ සමාලෝචනය**....1
**කෙටි හැඳින්වීම**....1
**මුදුන් පමුණුවා ගැනීම**....5
**වත්මන් කාර්ය සාධන වාර්තා සාරාංශය**....14
**ශිෂ්‍ය සම්බන්ධතා හා සුභසාධන කටයුතු**....14
**2013 වසරේ උපාධිදාරීන් ගේ සංෂිප්තය**....15
ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගනුම් ක්‍රම....16
ප්‍රායෝගික වැදගත්කම් සහිත විෂය ඒකක හඳුන්වාදීම....16
ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල - ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම....16
විශ්වවිද්‍යාල නගර ව්‍යාපෘතිය....17
උපාධි ප්‍රදානෝත්සව දිනයට උපාධිදාරී රැකියා නියුක්තිය....18
නේවාසික පහසුකම්....20
**කාර්යමණ්ඩල සාරාංශය**....21
අධ්‍යයන , විධායක , අධ්‍යයන සහයක හා අනධ්‍යයන කාර්යමණ්ඩල සාරාංශය....21
**සාමාන්‍ය හැඳින්වීම**....23
විශ්වවිද්‍යාලයේ නිලධාරීන්....23
විශ්විද්‍යාලයේ පාලක බල මණ්ඩලයය....24
**පරිපාලන නිලධාරීන්**....28
**මූල්‍ය පරිපාලන නිලධාරීන්**....30
**විශ්වවිද්‍යාලයේ පීඨ**....31
**මනව ශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**....31
**පීඨය මඟින් පිරිනමන උපාධි හා ඩිප්ලෝමා**....32
**පීඨය විසින් නිකුත් කරන ලද 2012 වර්ෂයේ ප්‍රතිඵල විස්තර**....34
**ශිෂ්‍ය හා සම්පත් විස්තරය**....36
දේශිය ශිෂ්‍ය විස්තරය 2013....37
විදේශිය ශිෂ්‍ය විස්තරය....38
අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර....39
අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර....39
**සිදුනරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන**....40
වැඩ සටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු විස්තර....40
ලැබූ ප්‍රධාන පිළිබඳ විස්තර....41
නව පාඨමාලා ආරම්භ කිරීම් පිළිබඳ විස්තර....41
**ව්‍යවහාරික විද්‍යා පීඨය**....42

**පීඨය මඟින් පිරනමන උපාධි සහ පශ්චාද් උපාධි ඩිප්ලෝමා** ....................42
ශිෂ්‍ය හා සම්පත් විස්තර....................45
දේශිය ශිෂ්‍ය සංඛ්‍යා පිළිබඳ විස්තරය....................46
**විදේශ සිසුන් පිළිබඳ විස්තර**....................46
අධ්‍යයන කාර්යමණ්ඩල විස්තර ....................47
**අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර** ....................48
**සිදුකරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන**....................48
**වැඩ සටහන්ල සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර** ....................48
ලැබූ ප්‍රධාන පිළිබඳ විස්තර....................48
නව පාඨමාලා ආරම්භ කිරීම පිළිබඳ විස්තර ....................49
**කළමානාකරණ අධ්‍යාපන හා වාණිජ විද්‍යා පීඨ** ....................50
**පීඨය මඟින් පිරිනමන උපාධි සහ ඩිප්ලෝමා**....................51
ශිෂ්‍ය හා සම්පත් විස්තර....................55
දේශිය ශිෂ්‍ය විස්තර....................56
අධ්‍යන කාර්මණ්ඩල විස්තර....................56
අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර ....................57
**පර්යේෂණ හා ප්‍රකාශණ පිළිබඳ විස්තර**....................58
වැඩ සටහන් **ල** සම්මන්ත්‍රණ හා වැඩමුළු විස්තර ....................58
ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර....................60
නව පාඨමාලා ආරම්භ කිරීම පිළිබඳ විස්තර....................60
වෛද්‍ය විද්‍යා පීඨය....................61
**පීඨය මඟින් පිරිනමන උපාධි සහ පශ්චාද් උපාෂි ඩිප්ලෝමා** ....................62
ශිෂ්‍ය හා සම්පත් විස්තර....................63
දේශිය ශිෂ්‍ය විස්තරය....................64
විදේශ සිසුන් පිළිබඳ විස්තර ....................64
අධ්‍යයන කාර්යමණ්ඩල විස්තර ....................65
**අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර**....................66
**සිදුකරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන**....................66
වැඩ සටහන්**ල** සමත්න්ත්‍රණ හා වැඩමළු විස්තර....................66
**ලැබූ ප්‍රදාව පිළිබඳ විස්තර**....................67
**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය** ....................68
අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර ....................75
ශිෂ්‍ය කරයුතු ශිෂ්‍ය සුහසාධන කටයුතු සහ සිසුන් ඇතුල් කිරීම ....................76
**සිසුන් අතුල් කිරීම**....................76
ලියපදිංචි කිරීම පිළිබඳ තොරතුරු....................76
ශිෂ්‍යාධාර....................77
**විභාග අංශය**....................78

**විශ්වවිද්‍යාලීය වෛද්‍ය මධ්‍යස්ථානය**................................................80

**ශාරීරික අධ්‍යාපන අංශය**................................................80

කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය................................................84

බාහිර විභාග අංශය................................................87

පුස්තකාලය................................................88

අභ්‍යන්තර විගණන අංශය................................................89

මූලධන වැඩ හා ගොඩනැගිලි වැඩිදියුණුදිකිරීම්................................................90

වර්ෂය සඳහා අධ්‍යයන පරිපලන අධ්‍යයන සහය සහ අධ්‍යයන නොවන කාර්යමණ්ඩල තොරතුරු................................................92

  අධ්‍යයන පරිපලන හා අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල විස්තර................................................92

  අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර................................................94

**ඉදිරි සැලැස්ම**................................................97

**වාර්ෂික ගිණුම් වාර්තා**................................................99

**පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර**................................................100

**මූල්‍ය ක්‍රියාවලි විශ්ලේෂණය 2013 එක් ශිෂ්‍ය පිරිවැය අනුව ( අභ්‍යන්තර උපාධි අපේක්ෂක )**................................................100

**මූලධන වියදම් විස්තර**................................................101

**මූල්‍ය කාර්යඵල විශ්ලේෂ-** 2013................................................101

**2013 වසර ඇතුළුව ආසන්න පස් වසර තුළ පුනරාවර්තන වියදම්**................................................102

**පසුගිය වසර පහ තුළ මූල්‍ය ආධාර තොරතුරු සාමාලෝචනය**................................................103

**පසුගිය වසර පහ තුළ මූල්‍ය වියදම් තොරතුරු සාමාලෝචනය**................................................104

**2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපති වාර්තාව**................................................111

## විශ්වවිද්‍යායේ නිල ලාංඡනය

විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය කහ පැහැති පසුබිමක වෘත්තාකාර ස්වරූපයකින් තිබෙන අතර එහි පරිවරණයේ ඒක කේන්ද්‍රිය වෘත්ත තුනක් එකිනෙකට සමීප ව පිහිටා ඇත. මෙම වෘත්තය මධ්‍යයේ කුඩා ඒකකේන්ද්‍රිය වෘත්තයක නෙලුම් මලක් සටහන් වී ඇති අතර නෙලුම් මලේ එක් පෙති තට්ටුවක් යටින් තව පෙති තට්ටවක් ආකාරයට පෙති තට්ටු දෙකක් වේ. වෘත්තය මධ්‍යයේ ඒකකේන්ද්‍රිය වෘත්ත දෙකට මැදි ව මලේ කේශර පිහිටා ඇත. නෙලුම් මල පිහිටි ඒකකේන්ද්‍රිය වෘත්තයට පිටතින් ද ඒකකේන්ද්‍රිය වෘත්ත තුනට මැදිවන සේ පහතින් විශ්වවිද්‍යාලයේ නම සිංහල අක්ෂරවලින් දැක්වේ. එහි ඉහළින් පුරාණ බෞද්ධ ග්‍රන්ථයකින් උපුටාගත් "***විජ්ජා උප්පතතං සෙට්ඨා*** " යනුවෙන් සදහන් ආදර්ශ පාඨය සදහන් වේ.

## විශ්වවිද්‍යාලයේ දැක්ම

" ඉගෙනීම තුළින් ජීවිත සෞභාග්‍යවත් කිරීම "

## විශ්වවිද්‍යාලයේ මෙහෙවර

" අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් උද්දාමයට සහ ප්‍රබෝධයට පත් වෙමින් ජාතියේ සෞභාග්‍යය උදෙසා දැනුම වර්ධනය කිරීම සහ බෙදා හැරීම "

# උපකුලපතිගේ සමාලෝචනය

## කෙටි හැඳින්වීම

1958 අංක 45 දරණ විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පනත මගින් 1959 පෙබරවාරි මස 16 දින විද්‍යෝදය විශ්වවිද්‍යාලය ආරම්භ විය. ආරම්භයේ විශ්වවිද්‍යාලය මාලිගාකන්දේ පිහිටි අතර 1961 දී වර්තමාන භූමියට ගෙන එන ලදී.

1972 වර්ෂයේ අංක 1 දරණ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පනත ක්‍රියාත්මක වීමත් සමඟ සියලුම විශ්වවිද්‍යාල මණ්ඩප බවට පරිවර්තනය විය ඒ අනුව විද්‍යෝදය මණ්ඩපය බවට පත්වී අධ්‍යාපන ඇමති විසින් පත් කරන ලද මණ්ඩපාධිපතිගේ යටතට පත්විය. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත ක්‍රියාත්මක වීමත් සමඟ මණ්ඩප යළිත් විශ්වවිද්‍යාල ලෙස නම් කරන ලද අතර විද්‍යෝදය විශ්වවිද්‍යාලය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යනුවෙන් නම් කරන ලදී.

වර්තමානයේ විශ්වවිද්‍යාලය පීඨ පහකින් සමන්විතය. එනම් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, කළමානාකරණ අධ්‍යයන හා වාණිජ්විද්‍යා පීඨය, වෛද්‍යවිද්‍යා පීඨය හා පශ්වාද් උපාධි අධ්‍යයන පීඨය වශයෙනි. ඊට අමතරව කොළඹ 8 හි පිහිටි කළමනාකරණ පශ්වාද් උපාධි අධ්‍යයන ආයතනය ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ වූවකි.

ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව මගින් පාලනය වන අක්කර 100කින් සමන්විත යගිරල වන රක්ෂිතය අධ්‍යාපන හා පර්යේෂණ වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරිකවිද්‍යා පීඨයට අයත් වන අතර එහි දියුණු කිරීම් සහ පර්යේෂණ සඳහා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශයට භාර දී ඇත. මේ වන රක්ෂිතයේ නියුතු පිරිසගේ අධ්‍යාපන සහ පර්යේෂණ සඳහා පර්යේෂණ සුදුසුකම් සහිත මධ්‍යයස්ථානයක් සකස් කොට ඇත. බංගලාවක ස්වරූපය ගත් මෙම ස්ථානය වන වැහි පිළිබඳ පළපුරුද්දක් ලැබීමට කැමැත්තක් දක්වන්නගේ ආගන්තුක මධ්‍යස්ථානයක් ද වන අතර ගම්මුන්ගේ ආගන්තුක සත්කාරයට ලක්වේ.

වෛද්‍ය පීඨය වෛද්‍ය හා පාරා වෛද්‍ය උපාධි පිරිනමන අතර පීඨයේ ශික්ෂණ රෝහල් වශයෙන් දකුණු කොළඹ කලුබෝවිල රෝහල සහ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල කටයුතු කරනු ලැබේ.

''විශ්වවිද්‍යාල හයක් ජ්‍යාතනන්තර මට්ටමට උසස් කිරීම'' ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ විශ්වවිද්‍යාල අතුරින් එකක් වූ මෙම විශ්වවිද්‍යාලය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ අධාර මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වු අතර විශ්වවිද්‍යාලය මගින් ඉදිරිපත් කරල ලද යෝජනාව බලධාරීන් විසින් පිළිගෙන ඇත මේ අනුව ''ලෝක තත්වයේ විශ්වවිද්‍යාල'' නමින් ව්‍යාපෘතියක් ආරම්භ කොට බහු ශික්ෂණය යටතේ විශේෂත්වයක් දක්වන පරිදි ආචාර්ය උපාධි සඳහා අයදම්පත් කැඳවන ලදී ව්‍යාපෘතිය 2011 වර්ෂයේ ආරම්භ කරන ලද අතර සමාලෝචිත වර්ෂය තුලද ක්‍රයාත්මක වේ. 2011

වර්ෂයේ අධාර සඳහා ව්‍යාපෘති 18ක් තොරා ගන්නා ලදී. මෙම 18න් ව්‍යාපෘති 9ක් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ විය.

විශ්වවිද්‍යාලය ආරම්භයේ පටන් කුලපතිවරුන් 07 දෙනෙකු සහ උපකුලපතිවරුන් 28 දෙනකු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ජනාධිපතිවරයා විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පත් කොට ඇත. එම විස්තර ලේඛන අංක 1 හි සඳහන් වේ.

| කුලපති | කාලය | උපකුලපති | කාලය |
|---|---|---|---|
| ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක මහතා (නිල බලයෙන්) | 1959-1962 | වැලිවිටියේ සෝරත නාහිමි | 1959 ජනවාරි<br>1963 ජූලි |
| ගරු විලියම් ගොපල්ලව මහතා | 1962-1977 | පූජ්‍ය පලන්නොරුවේ විමලධම්ම නාහිමි | 1963 අගෝස්තු<br>1966 සැප්තැම්බර් |
| | | පූජ්‍ය පරවාහැර වජිරඥාන නාහිමි | 1966 මාර්තු<br>1966 සැප්තැම්බර් |
| | | පූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමි | 1966 ඔක්තෝබර්<br>1966 නොවැම්බර් |
| | | පූජ්‍ය වල්පොල රාහුල හිමි | 1966 නොවැම්බර්<br>1969 ජූලි |
| | | මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිආරච්චි මහතා | 1969 අගෝස්තු<br>1970 අගෝස්තු |
| | | මහාචාර්ය හේම එල්ලාවල මහතා (උපකුලපති /මණ්ඩපාධිපති) | 1970 සැප්තැම්බර්<br>1972 සැප්තැම්බර් |
| | | මහාචාර්ය වී.කේ. සමරනායක මහතා (මණ්ඩපාධිපති) | 1972 ඔක්තෝබර්<br>1973 සැප්තැම්බර් |
| | | මහාචාර්ය එම්.ඩී.සී ධර්මවර්ධන මහතා | 1974 මාර්තු |

| | | | |
|---|---|---|---|
| | | | 1975 ජනවාරි |
| | | මහාචාර්ය ඩබ්.එම්.කේ . විජේතුංග මහතා | 1975 පෙබරවාරි<br>1977 මැයි |
| අතිගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපති ( නිල බලයෙන්) | 1978-1979 | මහාචාර්ය ටියුලි ද සිල්වා මහතා | 1977 ජුනි<br>1978 ජූලි |
| ආචාර්ය ඊ.ඩබ්ලිව්.අදිකාරම් මහතා | 1979.01.01 සිට<br>1983-12-31 | මහාචාර්ය කේ. ජිනදාස පෙරේරා මහතා(උපකුලපති /මණ්ඩපාධිපති) | 1979 ජනවාරි<br>1981 දෙසැම්බර් |
| | | මහාචාර්ය ටී.බී. කාන්ගහආරච්චි මහතා | 1982 ජනවාරි<br>1983 ජනවාරි |
| ආචාර්ය විමලා ද සිල්වා මිය | 1984-02-01 සිට<br>1989-01-31 | කරුණාසේන කොඩිතුවක්කු මහතා(නිසි බලධාරි) | 1983 පෙබරවාරි 7<br>1984 මාර්තු 12 |
| | 1989-02-01 සිට<br>1994-01-31 | කරුණාසේන කොඩිතුවක්කු මහතා | 1984 මාර්තු 13<br>1988 අප්‍රේල් 7 |
| | 1994-02-01 සිට<br>1999-01-31 | මහාචාර්ය එල්.පී.එන්. පෙරේරා මහතා | 1988 අප්‍රේල්<br>1990 සැප්තැම්බර් |
| | 1999-02-01 සිට<br>2004-01-31<br>2001-08-31 දින ඉල්ලා අස්විය. | මහාචාර්ය එස්. බී. හෙට්ටිආරච්චි මහතා | 1990 ඔක්තෝබර්<br>1992 ඔක්තෝබර් |
| | | ඩබ්ලිව්. බී. දොරකුඹුර මහතා | 1992 නොවැම්බර්<br>1995 ඔක්තෝබර් |
| | | මහාචාර්ය පී. විල්සන් මහතා | 1995 නොවැම්බර්<br>1999 අප්‍රේල් |

| | | | |
|---|---|---|---|
| | | මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා<br>වැ.බ. උපකුලපති | 1999 මැයි |
| ආචාර්ය මැදගොඩ සුමනතිස්ස නාහිමි | 2002-03-22<br>සිට<br>2007-03-21 | මහාචාර්ය ජේ. ඩබ්. වික්‍රමසිංහ | 1999 ජූනි<br>2002 මැයි |
| | | මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා<br>වැ.බ. උපකුලපති | 2002 ජූනි<br>2002 ඔක්තෝබර් |
| | | ආචාර්ය ඩී.එස්. එපිටවත්ත මහතා | 2002 ඔක්තෝබර්<br>2003 දෙසැම්බර් |
| මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි | 2005-07-19<br>සිට<br>2010-07-18 | මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර මහතා | 2004 ජූලි 27<br>2005 ඔක්තෝබර් |
| මහාචාර්ය බෙල්ලන්විල්ල විමලරතන නාහිමි | | මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා | 2005 නොවැ 30<br>2008 සැප්තැ |
| මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි | 2010-07-19<br>සිට<br>2015-07-18 | ආචාර්ය එන්.එල්.ඒ. කරුණාරත්න මහතා<br>වැ.බ. උපකුලපති | 2008 ඔක්තෝ<br>2008 නොවැ 15 |
| මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි | | ආචාර්ය එන්. එල්.ඒ කරුණාරත්න මහතා | 2008 නොවැ 16<br>2011 නොවැ 15 |
| මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි | | ආචාර්ය එන්. එල්.ඒ කරුණාරත්න මහතා | 2011 නොවැ 16<br>සිට මේ දක්වා |

වගු 1. **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති විසින් පත් කරන ලද උපකුලපතීන්ගේ ලේඛනය.**

## මුදුන් පමුණුවා ගැනීම

**සාමාන්‍ය**

විමර්ශනයට අදාල වූ වර්ෂය තුළ විශ්වවිද්‍යාලය එකම දිනක් හෝ වාසා නොතැබින. සන්සුන් වාතාවරණයක් පැවති අතර විශ්වවිද්‍යාල සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වැඩිදියුණු විය. මේ හේතුවෙන් විශ්වවිද්‍යාල භූමිය තුළ සිසුන්ට නිදහසේ එහා මෙහා යෑම හැකිවූ අතර පුස්තකාල භාවිතය ක්‍රීඩා කටයුතු මෙන්ම අනිකුත් පහසුකම් ප්‍රයෝජනයට ගතහැකි විය.

**ආදිකර්තෘන් උත්සවාකාරයෙන් සැමරීම**

අප්‍රේල් මස 30වන දින හා ජූලි මස 17 වන දින විශ්වවිද්‍යාලයේ ආදි කර්තෘන්වන හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමි සහ විශ්වවිද්‍යාලයේ ආරම්භක උපකුලපති වැලිවිටියේ සෝරත නාහිමියන් උත්සවාකාරයෙන් සමරන ලද අතර සමරු දේශනය පවත්වන ලද්දේ ස්වෝර්ජිත මහාචාර්ය රත්න විජේතුංග මහතා විසිනි. අති පූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සොරත නාහිමියන්ගේ 50 වන ගුණසමරනොත්සවය අති උත්කර්ශවත් අයුරින් සිදු කරන ලද්දේ උන්වහන්සේගේ පිළිමයක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් නිරාවරණය කිරීමෙනි. මෙම ලෝකඩ පිළිමය පරිත්‍යාග කරන ලද්දේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා විසිනි.

## ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති

- විශ්වවිද්‍යාල භූමිය තුළ වගා කිරීමේ ව්‍යාපෘතියක් තවදුරටත් ක්‍රියාත්මත වූ අතර පලදාව වෙලදපලේ මිලට අඩු මුදලකට සේවකයන් සඳහා අලෙවි කරන ලදී. එම මුදල් විශ්වවිද්‍යාලයීය අරමුදලට බැරකරන ලදී.
- සිසුන්ගේ, ආචාර්ය මණ්ඩලයේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ එක්සත් සමාජීය වගකීම් කටයුතු තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා උපකාර කරන ලදී.
- විවිධ පුද්ගලයන්ගේ සහ සංවිධානවලින් විශ්වවිද්‍යාලයීය සිසුන් උදෙසා ශිෂ්‍යත්ව ක්‍රමයන් තවදුරටත් පවත්වගෙන යන ලදී.
- ජාතික මට්ටමේ වැදගත් කමින් යුත් ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානයක් (CDR) රු 92,632,0401/- වියදමින් ක්ෂුද්‍ර ජීවි විද්‍යා අධ්‍යානංශයේ පිහිටුවීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගන්නා ලදී.
- මානව ශාස්ත හා සමාජීය විද්‍යා පීඨයේ ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යානාංශය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහයෝගිතාව යටතේ පුරාවිද්‍යා ගවේශන කටයුතු පුරාවිද්‍යා හා වාස්තු

විද්‍යා සංරක්ෂණ යටිතල පහසුකම් බිම් සැකසීම නඩත්තු හා ඉදිකිරීම සහ පරිපාලන සේවා රජගල පුරාවිද්‍යා සංරක්ෂිතයේ ආරම්භ කරන ලදි.

- 

ඩෙංගු පර්යේෂණ ආයතනයේ (CDR) කටයුතු තෘප්තිදායක ආකාරයෙන්ම ක්‍රියාත්මක වූ අතර රුපියල් මිලියන 92,632,0401/- ක වියදමින් ජාතික වැදගත්කම සඳහා කැබිනට් අනුමැතිය ඇතිව ක්ෂුද්‍රජීව විද්‍යා අංශයේ ස්ථාපනය කරනු ලැබූ අතර සළකා බලනු ලබන වර්ෂයේ මෙහි ප්‍රගතිව විශිෂ්ඨය. මෙහි විජයග්‍රහනයනම් (1) විශිෂ්ඨ ලිඛිත ත්‍යාගය 2013 අසාත්මිකතාව හා සායනික ප්‍රතිශක්ති විද්‍යා සම්මේලනය සඳහා ඉදිරිපත් කරන ලද උග්‍ර ඩෙංගු වසංගතයේ IL-10 විසින් ප්‍රතිකාර කරනු ලබන විශේෂ වෛරස් ප්‍රතිශක්ති මැඩලීම සහ (2) ප්‍රතිකාරයක් සඳහා වන විශිෂ්ඨ ලිඛිත ත්‍යාගය, 2013 දී තායිලන්තයේ පැවති, ඇදුම සහ ප්‍රතිශක්ති විද්‍යා සංම්මේලනය සඳහා ඉදිරිපත් කරන ලද, T සෛල විශේෂ ඩෙංගු වෛරසයේ සහ ආසියානු කලාපයේ දී ශ්‍රී ලාංකික විශාල පුද්ගල පිරිසක් උග්‍ර සායනික රෝගයට ප්‍රතිදේහ අනුකූලතාවය හා එහි දායකත්වය අර්ථ දැක්වීම.

- රජගල පුරාවිද්‍යා රක්ෂිතයේ, පුරා විද්‍යාත්මක පර්යේෂණ, පුරාවිද්‍යාත්මක හා වාස්තු විද්‍යා සංරක්ෂණය , යටතල පහසුකම්, භූමි අලංකරණ පිරිසැකසුම්, නඩත්තු කිරීම, සහ පරිපාලන සේවා සැලැස්ම හෝ ලබාදීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධාර උපාකාර ඇතිව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයයේ ඉතිහාස හා පුරාවිද්‍යා අංශය විසින් ආරම්භකරන ලද කාර්යයන් ඉදිරියට කරගෙනයනු ලැබීය. මේ සඳහා වන අරමුදල් විශ්වවිද්‍යාලය විසින් තරඟකාරී ක්‍රමවේදයකට මුහුණ දී විශාල ප්‍රදානයක් ඇමරිකානු තනාපති අරමුදල්ලෙස ලබාගත්තේය.

- ලෝක පරිමානයයේ විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය
  උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ ස්ථාපන කර තිබෙන ලෝක පරිමාණයේ විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය (WCUP) සාධනීය ජයග්‍රහණයන් සනිටුවන් කර ඇත.
  ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයට හවුල්කාර කොටස්කරු තත්වයෙන් පත්කර ගැනීම, මහාචාර්ය රනිල් ද සිල්වා මහතා, අධ්‍යයක්ෂ (WCUP) සමත්විය. මහාචාර්ය හෙරි ස්ටෙරිනබුෂ් අධ්‍යක්ෂ, මානසික සෞඛ්‍ය හා සනායු විද්‍යා(EURON),මැස්ට්‍රිච්ට් විශ්වවිද්‍යාලය, නෙදර්ලන්ත සහ ආචාර්ය එන්.එල්.ඒ.කරුණාරත්න, උපකුලපති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ප්‍රධානත්වයෙන් 2013 දෙසැම්බර් 09 වන දින EURON හා USJP අතර අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කිරීමටත්, European Graduate School of Neurosicence (EURON) සමඟ ශ්‍රී ජයවර්ධනපුර විශ්විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයට හවුල්කාර කොටස්කරු තත්වයන්ගෙන් එක්කර ගැනීමට මහාචාර්ය රනිල් ද සිල්වා මහතා, අධ්‍යක්ෂ WCUP සමත්විය. වසර 7ක (2007-2013) කාලයක් සඳහා යුරෝ බිලියන 54ක් උසුලන පර්යේෂණ නව සොයාගැනීම් සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරීම සඳහා යුරෝපියානු සංගමය අත්පත් කරගනු ලබීය.

- කර්යමණ්ඩල ක්‍රිකට් කණ්ඩායම ජේ.පී ක්‍රිකට් ඇකඩමිය විසින් සංවිදානය කර 2013 නොවැම්බර් 23 - 30 දිනයන්හි ඉන්දියාවේ බැංගලෝරයේ දි පවතවන ලද ක්‍රිකට් තරඟාවලියේ අනුශුරතාව, විශිෂ්ඨතම පිතිකරු, විශිෂ්ඨතම පන්දුයවන්නා හා තරඟාවලියේ ශූරතාය සම්මාන දිනාගන්නා ලදී.
- 2013 දෙසැම්බර් 5,6 දිනයන් හි ටොරින්ටන් ක්‍රීඩාංගනයේ දී පවත්වන ලද 2013 වසරේ රජය සේවා මලල ක්‍රීඩා ශූරතාව හා රන් පදක්ම් 03ක් , රිදී පදක්කම් 09 හා ලෝකඩ පදක්කම් 02ක් දිනාගැනීමට සමත්විය.

**ආරක්ෂක කටයුතු ශිෂ්‍ය විනය සහ නවක වදය**

විමර්ශනයට අදාල වර්ෂය තුළ නවක වදයට අදාල සිදුවීම් කිසිවක් නෙවීය.

**විමර්ශනයට අදාල වරෂය තුළ සාර්ථකකරගන්නා ලද විශේෂ සිදුවීම්**

**අධ්‍යන විශේෂ සිදුවීම්**

- ව්‍යුහ විද්‍යා ආපන ශාලාවේ දී පවත්වන ලද වෛද්‍ය විද්‍යා පීඨ සංගමය මඟින් පවත්වන ලද පොත් ප්‍රදර්ශනය (03/04/2013)
- සුමංගල කියවීම් ශාලාවේදී පවත්වන ලද මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ සිංහල හා ජනසංනිවේදන අධ්‍යනාංශය මගින් සංවිධානය කරන ලද ජීවත බේරාගැනීම පිළිබඳ දේශනය (13/06/2013)
- ව්‍යවහාරික විද්‍යාපීඨ කියවීම් ශාලාවේ දී පවත්වන ලද විශ්ව ගම්මානයක් සංවිධානය කිරීම AIESEC (20/03/2013)
- කළමානාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යනාංශය මඟින් සංවිධානය කරන ලද කාව්‍ය සංග්‍රහය (10/05/2013)
- උද්භිද විද්‍යා අධ්‍යයනාංශය අසල ව්‍යවහාරීක විද්‍යා පීඨයේ උද්භිද විද්‍යා සංගමය මගින් සංවිධානය කරන ලද ආහාර සංදර්ශනය (15/05/2013)
- Ratter react Club මගින් සංවිධානය කොට Fayol Hall හි පවත්වන ලද අලෙවි කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය (30/10/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ Rotaract Club මගින් සංවිධානය කොට Fayol ශාලාවේ පවත්වන ලද "සත්මින"
- මානව සම්පත් කළමානාකරණ අධ්‍යනාංශ සංගමය විසින් සංවිධානය 2013 වැඩසටහන හා සොරත මන්දිරයේ ප්‍රධාන ශාලාවේ දී පවත්වන ලදී (29/09/2013)
- මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන සංගමය විසින් සංවිධානය කර සොරත මනිදිරයේ ප්‍රදාන ශාලාවේ දී පවත්වන ලද "Vigour"වැඩ සටහන (03/10/2013)

ක්‍රීඩා

- ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය මගින් සංවිධානය කොට පහළ පිට්ටනියේ පවත්වන ලද ක්‍රිකට් තරඟය (16/06/2013)
- විදුදය විද්‍යා සහෝදරත්වය මඟින් සංවිධානය කොට පහළ පිට්ටනියේ පවත්වන ලද විනෝදාත්මක තරඟය (22/06/2013)
- පානදුර ජපුර සිසුන් විසින් සංවිධාන කොට පහළ පිට්ටනියේ පැවත්වූ ක්‍රිකට් තරඟ හා Malty තරඟය(30/08/2013)
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ කතෝලික සංගමය මඟින් සිවිධානයකොට විශ්වවිද්‍යාල පිට්ටනියේ පවත්වන ලද වාර්ෂික ක්‍රීඩා දිනය (01-09-2013)
- මහජන සංගමය මගින් පිට්ටනියේ පවත්වන ලද ක්‍රිකට් තරඟය (16/06/2013)
- ව්‍යවසායකත්ව අධ්‍යනාංශය මඟින් සංවිධානය කොට විශ්වවිද්‍යාල පිට්ටනියේ පවත්වන ලද වෙස් ක්‍රිඩාව (13/07/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ආර්ථික විද්‍යා විෂය සංගමය මගින් සංවිධානය කොට විශ්වවිද්‍යාල පිට්ටනියේ පැවැත්වූ ක්‍රිකට් තරඟය(22/11/2013)
- ඉංග්‍රිසි අධ්‍යයනාංශය මඟින් සංවිධානය කොට පැවැත්වූ වාර්ෂික ක්‍රිකට් තරඟය (25/11/2013)

අගමික සංස්කෘතික හා සුභ සාධන කටයුතු

- විශ්වවිද්‍යාලයේ නඩත්තු අංශයේ කාර්ය මණ්ඩලය මගින් සංවිධානය කරන ලද බෞද්ධ වැඩ සටහන (03/01/2013)
- බෞද්ධ සංගමය මගින් සංවිධානය කරන ලද බෞද්ධ සම්මන්ත්‍රණය (21/01/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ කතෝලික ශිෂ්‍ය සංගම මගින් සංවිධානය කරන ලද SBGF හි පවත්වන ලද සතිපතා යඥා පූජාව (සතිපතා)
- කතෝලික ව්‍යාපාරය මගින් සංවිධානය කරන ලද ව්‍යවහාරික විද්‍යා ඒ 1 ශාලාවේ පවත්වන ලද පූජාව (04/02/2013)
- AIESEC ශිෂ්‍ය ව්‍යාපාරය මඟින් සංවිධානය කරන ලද කියවීම් ශාලාවේදී පවත්වන ලද සංස්කෘතික සංදර්ශනය (27/03/2013)
- වාණිජ විද්‍යා සංගමය මගින් සංවිධාන කර බණ්ඩාර නායක ශාලාවේ සහ කියවීම් ශාලාවේ පවත්වන ලද සත් බදු වන්දනාව (02/04/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විදයා පීඨය මගින් සංවිධානාය කර බුදු මැදුර අසල පවත්වන ලද බෝධි පුජාව (24/04/2013)
- කතෝලික ව්‍යාපාරය මගින් සංවිධානය කොට ව්‍යවහාරික විද්‍යා ඒ 1 ශාලාවේ දී පැවැත්වූ පූජාව (25/04/2013)
- ව්‍යවහාරික විද්‍යා පීඨයේ දෙවන වසර සිසුන් විසින් සංවිධානය කොට බුදු මැදුර අසල පැවැත්වූ බෝධි පූජා පින්කම(10, 13,14/05/2013)
- බෞද්ධ සංගමය මගින් සංවිධානය කොට විශ්වවිද්‍යාල භූමිය තුළ පැවැත්වූ වෙසක් සංදර්ශන වැඩසටහන (20, 21, 22/05/2013)
- උද්භිද විද්‍යා සංගමය මගින් සංවිධානය කොට උද්භිද විද්‍යා ගොඩනැගිල්ල අසල පවත්වන ලද අයිස් ක්‍රීම් දන්සැල (22/05/2013)
- ආර්ථික විද්‍යා සංගමය මගින් සංවිධානය කර සුමංගල ගොඩනැගිල්ල ඉදිරිපස පවත්වන ලද සව් දන්සැල (23/05/2013)

- ගණකාධිකරන අධ්‍යයනාංශය මගින් සංවිධානය කර අඹතලේ ආරන්‍යයේ පවත්වන ලද දානය (29/05/2013)
- ව්‍යවහාරික විද්‍යා ශිෂ්‍ය සංගමය මගින් සංවිධානය කර පීඨ කාර්යාලය අසල පවත්වන ලද දන්සැල (30/05/2013)
- භික්කු සංගමය මගින් සංවිධානය කර සුමංගල ගොඩනැගිල්ල හා බුදුමැදුර අසල පවත්වන ලද විදුදය පොසොන් කාලපය (17,18, 19/06/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ ව්‍යාපාර පරිපාලන විද්‍යා සංගමය විසින් සංවිධානය කරන ලද වාර්ෂික පිරිත් දේශනා උත්සවය (18/06/2013)
- සිංහල හා ජනසංනිවේදන සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පවත්වන ලද පහන්තරු වැඩසටහන (02,03,04/07/2013)
- බෞද්ධ සංගමය මගින් සංවිධානය කොට මාරවිල මධ්‍යමහා විද්‍යාලයේ පවත්වන ලද දානමය වැඩ සටහන (13/07/2013)
- කතෝලික සංගමය මගින් සංවිධානය කොට එස් 1 ශාලාවේදී පැවැත්වූ දිව්‍ය පුජා වැඩසටහන (01/09/2013)
- ඉතිහාසය හා පුරාවිද්‍යා සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ සංස්කෘතික සංදර්ශනය (29/10/2013)
- ව්‍යවහාරික විද්‍යා සංගමය මගින් සංවිධානය කොට සුමංගල ගොඩනැගිල්ලේ පවත්වන ලද ලේ ලන්දීමේ ව්‍යාපාරය(05/11/2013)
- ඉතිහාසය සහ පුරා විද්‍යා සංගමය මගින් සංවිධානය කොට සුමංගල ගොඩනැගිල්ල ඉදිරිපස පැවැත්වූ ඖසු පැන් විකිණීම (06/11/2013)
- කතෝලික සංගමය මගින් සංවිධානය කොට ව්‍යවහාරික විද්‍යා ප්‍රධාන ශාලාවේදී පැවැත්වූ නත්තල් භක්ති ගීත(03/12/2013)
- ව්‍යවහාරික විද්‍යා පීඨය මගින් සංවිධානය කර සුමංගල කියවීම් ශාලාවේ දී පැවැත්වූ ධර්ම දේශනාව (06/12/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් සංවිධානය කොට බුදු මැදුර අසල පැවැත්වූ අසූමහ ශ්‍රාවක වන්දනා (12/12/2013)

සමාජ ක්‍රියාකාරකම්

- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සංගමය මගින් සංවිධානය කරන ලද කස ගස් සෙවනේ පවත්වන ලද පිළිගැනීමමේ උත්සවය(02-03/01/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අපරාධ විද්‍යා සංගමය විසින් සංවිධානය කර සුමංගල කියවීම් ශාලාවේ පවත්වන ලද පිළිගැනීමේ උත්සවය (09/01/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් සංවිධානය කර ක්‍රීඩා පිටියේ පවත්වන ලද පිලිගැනීමේ උත්සවය (15/01/2013)
- ඉංග්‍රීසි අධ්‍යයනාංශය මගින් සංවිධානය කර සුමංගල කියවීම් ශාලවේ දී පවත්වන ලද පිළිගැනීමමේ උත්සවය (18/01/2013)
- භාෂා හා සංස්කෘත අධ්‍යනාංශය මගින් සංවිධානය කර කසගස් සෙවනේදී පවත්වන ලද පිලිගැනීමේ උත්සවය (22/01/2013)

- වෘත්තීය උපදේශක ඒකකය මගින් සංවිධානය කොට විශ්වවිද්‍යාල ක්‍රීඩා පිටියේ පවත්වන ලද පිළිගැනීමේ කටයුත්ත (24/01/2013)
- වෘත්තීය උපදේශක ඒකකය මගින් සංවිධානය කර විශ්වවිද්‍යාල ක්‍රීඩාපිටියේ පවත්වන ලද පින්තූර ගැනීමේ කටයුත්ත (03/02/2013)
- ආහාර විද්‍යා තාක්ෂණ අධ්‍යයනාංශය මගින් සංවිධානය කර කළමනාකරණ ශ්‍රවණාගාරයේදී පැවැත්වූ පහළ බැසයාම (22/02/2013)
- AIESEC ශිෂ්‍ය ව්‍යාපාරය මගින් සංවිධානය කර ක්‍රීඩාපිටියේ දී පැවැත්වූ ක්‍රියාකරකම් (04/03/2013)
- අලෙවි කළමනාකරණ අධ්‍යනාංශය මගින් සංවිධානය කර කසගස් සෙවනේ දී පවත්වන ලද පිළිගැනීමේ උත්සවය (01/04/2013)
- ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය මගින් සංවිධානය කර කසගස් සෙවනේ දී පවත්වන ලද පිළිගැනීමේ උත්සවය (09/04/2013)
- මෙහෙයුම් කළමනාකරණය මගින් සංවිධානය කර සෝරත මන්දිරයේදී ප්‍රධාන ශාලාවේ දී පවත්වන ලද උත්සවය (10/05/2013)
- රාජ්‍ය පාරිපාලන විද්‍යා අධ්‍යනාංශය මගින් සංවිධානය කර සෝරත ප්‍රධාන ශාලාවේදී පවත්වන ලද උත්සවය (11/05/2013)
- විදුදය විද්‍යා සහෝදරත්වය මගින් සංවිධානය කර වන හා පරිසරික විද්‍යා අධ්‍යයනාංශයේ දී පවත්වන ලද වාර්ෂික මහා රැස්වීම (30/05/2013)
- දේපල කළමනාකරණ හා තක්සේරු සංගමය මගින් සංවිධානය කර සුමංගල කියවීම් ශාලාවේදී පැවැත්වූ වාර්ෂික මහා රැස්වීම (11/06/2013)
- ගණකාධිකරණ විෂය සංගමය මගින් සංවිධානය කර මවුන්ට් බ්‍රීස් හෝටලයේ දී පවත්වන ලද සුහද හමුව (21/06/2013)
- ව්‍යවසායකත්වය අධ්‍යනාංශය මගින් සංවිධානය කර පරිපාලන ගොඩනැගිල්ල පිටුපස පවත්වන ලද 2013 කාර් සේදීම (29/06/2013)
- ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය මගින් සංවිධායන කර විවෘත රඟහල අසල පවත්වන ලද කාර් සේදීම (5,6,7/07/2013)
- ව්‍යාපාර ආර්ථික විද්‍යා සංගමය මගින් සංවිධානය කර කොල්ලුපිටියේ කසකාවා ශාලාවේ දී පවත්වන ලද පිළිගැනීමේ උත්සවය (06/10/2013)
- මූල්‍ය අධ්‍යයනාංශය මගින් සංවිධානය කර කළමනාකරණ ප්‍රධාන ශාලාවේ දී පවත්වන ලද උත්සවය (30/10/2013)
- ගණකාධිකරණ අධ්‍යයනාංශය මගින් සංවිධානය කර කළමනාකරණ ප්‍රධාන ශාලාවේ පවත්වන ලද FMA වර්ණ රාත්‍රිය (31/10/2013)
- කළමනාකරණ පීඨය මගින් සංවිධානය කර කස ගස් සෙවනේ පවත්වන ලද Lipton Talent Hunt (07/11/2013)
- දේශපාලන විද්‍යා විෂය සංගමය මගින් සංවිධානය කර විශ්වවිද්‍යාල පිට්ටනියේ පවත්වන ලද සුහද හමුන (24/11/2013)
- එස් 1 ශාලාවේ දී පවත්වන ලද කතෝලික සංගමයේ වාර්ෂික මහා රැස්වීම (28/11/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් සංවිධානය කර Heartland City Hall, මීගොඩ පවත්වන ලද පිළිගැනීමේ උත්සවය (06/12/2013)
- මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය මගින් සංවිධානය කර සෝරත මන්දිර ප්‍රධාන ශාලාවේදී පැවැත්වූ HRM රත්‍රිය (07/12/2013)

- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය මගින් සංවිධානය කර බණ්ඩානායක ශාලාවේ දී පැවැත්වූ පිළිගැනීමේ උත්සවය(09/12/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් සංවිධානය කර විවෘත රඟහලේදී පවත්වන ලද සුහද හමුව (10/12/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය CEFEN මගින් සංවිධානය කරන ලද මෝස්තර සංදර්ශනය (13/12/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් සංවිධානය කර සුමංගල කියවීම් ශාලාවේදී පැවැත්වූ පිළිගැනීමේ උත්සවය (18/12/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් සංවිධානය කර සුමංගල කියවීම් ශාලාවේදී පැවැත්වූ පිළිගැනීමේ උත්සවය (18/12/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් සංවිධානය කර සුමංගල කියවීම් ශාලාවේදී පැවැත්වූ පිළිගැනීමේ උත්සවය (19/12/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පියය මගින් සංවිධානය කර විශ්වවිද්‍යාල පිට්ටනියේ පැවැත්වූ පිළිගැනීමේ උත්සවය (19/12/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පියය මගින් සංවිධානය කර සෝරත මන්දිරයේ දී පැවැත්වූ පිළිගැනීමේ උත්සවය (22/12/2013)

රංගන කළා හා නෘත්‍ය අංග

- සිංහල හා ජනසංනිවේදන අධ්‍යයනාංශය මගින් සංවිධානය කර බන්ඩරනායක ශාලාවේ පැවැත්වූ සංගීත දැක්ම (03/01/2013)
- AIESEC ශිෂ්‍ය සංවිධානය මගින් සංවිධානය කර ක්‍රීඩ භූමියේ පවත්වන ලද නැටුම් සංදර්ශනය (12/03/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට දර්ශනය (12/03/2013)
- කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට දර්ශනය (13/03/2013)
- දේපල කළමනාකරණ හා තක්සෙරු විද්‍යා අධ්‍යයනාංශය මගින් සංවිධානය කර විවෘත රඟහලේදී පවත්වන ලද සංගීත ප්‍රසංගය (08/04/2013)
- කළමනාකරණ පීඨ සංගමය මගින් සංවිධානය කොට කසගස් සෙවනේදී පවත්වන ලද සංගීත ප්‍රසංගය (09/04/2013)
- විද්‍යුදය විද්‍යා සහෝදරත්වය මගින් සංවිධානයකර ව්‍යවහාරික පීඨ කාර්යාගයේ පවත්වන ලද සංගීත ප්‍රසංගය (23/04/2013)
- තොරතුරු තාක්ෂණ සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරණායත ශාලාවේ දී පැවැත්වූ රූකඩ සංදර්ශනය (01/05/2013)
- සංඛ්‍යානය හා පරිගණක විද්‍යා අධ්‍යයනාංශය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට ප්‍රදර්ශනය(02/05/2013)
- මානව සම්පත් කළමානාකරණ අධ්‍යයනාංශය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට දැක්ම (08/05/2013)
- රූපන සංසදය මගින් සංවිධානය කොට බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට දැක්ම (09/05/2013)

- රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශ මගින් සංවිධානයට කොට කියවීම් ශාලාවේදී පැවැත්වූ කාව්‍ය සංග්‍රහය ((10/05/2013)
- ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පවත්වන ලද සිංහ රාත්‍රිය (16/05/2013)
- සිංහල හා ජනසංනිවේදන අධ්‍යයනාංශය මගින් සංවිධානය කොට බණ්ඩාරනායක ශාලාවේ පැවැත්වූ චිත්‍රපට සංදර්ශනය(03,04,06,07,10,13/06/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අවසන් වසර සිසුන් මගින් සංවිධානය කොට සුමංගල ගොඩනැගිල්ලේ පවත්වන ලද චිත්‍ර ප්‍රදර්ශනය (04,05,06/06/2013)
- මෙහෙයුම් කළමනාකරණ සංගමය මගින් සංවිධානය කොට බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ සත්සර වියමන (05/06/2013)
- අලෙවි කළමනාකරණ සංගමය මගින් සංවිධානය කොට මරදානේ ශාන්ත ජෝසප් විද්‍යාලයේ පවත්වන ලද සංගීත ප්‍රදර්ශනය (16/06/2013)
- ව්‍යාපාර පාරිපාලන විෂය සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේ පැවැත්වූ වේදිකා නාට්‍ය (20/06/2013)
- දර්ශනය සංගමය මගින් සංවිධානය කොට බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට සංදර්ශනය (17,18,19,23,24/07/2013)
- ඉතිහාසය හා පුරාවිද්‍යා සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට දැක්ම (14/08/2013)
- විදුදය විද්‍යා සහෝදරත්වය මගින් සංවිධානය කොට සෝරත මන්දරය ඉදිරිපිට පැවැත්වූ සහුර්ද යාත්‍රා (04-30/09/2013)
- ආහාර විද්‍යා සංගමය මගින් සංවිධානය කොට ව්‍යවහාරික විද්‍යා පීඨ ප්‍රධාන ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට ප්‍රදර්ශනය (25/09 – 03/10/2013)
- ගණකාධිකරනය සහ මූල්‍ය විෂය සංගමය මගින් සංවිධයානය කොට ව්‍යවහාරික විද්‍යා ශ්‍රවනාගාරයේදී පවත්වන ලද චිත්රපට ප්‍රදර්ශනය (26/09/2013)
- සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය මගින් සංවිධානය කර කසගස් සෙවනේ පැවැත්වූ Vigour 2013 (03/10/2013)
- මූල්‍ය අධ්‍යනාංශය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ නාද ප්‍රසංගය (08/10/2013)
- ව්‍යවහාරික විද්‍යා පීඨය මගින් සංවිධානය කර සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පවත්වන ලද සිසි අරුන්දතී (10/10/2013)
- අළෙවි කළමනාකරණ සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ මැජික් සංදර්ශනය (10/10/2013)
- ව්‍යාපාර පරිපාලන විද්‍යා සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට දැක්ම (11/10/2013)
- බණ්ඩාරනායක ශාලාවේදී පැවත්වූ රූපන සංසදය චිත්‍රපට දැක්ම (14/10/2013)
- අලෙවි කළමානාකරණ සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට දැක්ම (28/10/2013)
- අලෙවි කළමානාකරණ සංගමය මගින් සංවිධානය කර Hotel Perasus Reef හි පවත්වන ලද Disco Interno 2013 (02/11/2013)
- විදුදය විද්‍යා සහෝදරත්වය මගින් සංවිධානය කොට ව්‍යවහාරික විද්‍යා පීඨ පරිශ්‍රෙයහි පැවැත්වූ සංගීත වැඩසටහන (05/11/2013)

- විදුදය විද්‍යා සහෝදරත්වය මගින් සංවිධානය කර සුමංගල කියවීම් ශාලාවේදී පවත්වන ලද ගී මංසල (05/11/2013)
- ඉතිහාසය හා පුරාවිද්‍යා සංගමය මගින් සංවිධානය කරන ලද බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට සංදර්ශනය (06,20,27/11/2013)
- අපරාධ විද්‍යා සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට සංදර්ශනය (21/11/2013)
- අලෙවි කළමානාකරණ සංගමය මගින් සංවිධානය කරන ලද Vibes of Marketing (22/11/2013)
- මෙහෙයුම් කළමනාකරණ සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්වූ චිත්‍රපට දැක්ම (25/11/2013)
- රාජ්‍ය පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය මගින් සංවිධානය කොට බණ්ඩාරනායක ශාලාවේදී පවත්වන ලද චිත්‍රපට දැක්ම (28/11/2013)
- අලෙවි කළමනාකරණ සංගමය මගින් සංවිධානය කර කසගස් සෙවනේදී පැවැත්වූ Vibes of Marketing (28/11/2013)
- Rotaract Club මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පවත්වන ලද සංගීත (02/12/2013)
- සමාජ සංඛ්‍යාන සංගමය මගින් සංවිධානය කර බණ්ඩාරනායක ශාලාවේදී පවත්වන ලද චිත්‍රපට ප්‍රදර්ශනය (03/12/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් සංවිධානය කර සුමංගල ශාලාවේදී පැවැත්වූ ගීත විධි (10/12/2013)
- මානව ශාස්ත්‍ර හා සමාජිය විද්‍යා පීඨය මගින් සංවිධානය කර විද්‍යා ශ්‍රවනාගාරයේ පැවැත්වූ කවි මඩුව (13/12/2013)
- කළමානාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් සංවිධානය කර මහරගම තරුණසේවා සභාවේ පැවැත්වූ සාර සුයාමය (18/12/2013)
- අලෙවි කළමානාකරණ සංගමය මගින් සංවිධානය කොට ක්‍රීඩා භූමියේ පවත්වන ලද Vibes of Marketing වැඩසටහන (22/12/2013)

# ශිෂ්‍ය සම්බන්ධතා හා සුභසාධන කටයුතු


## 2013 උපාධිධාරීන් සහ පශ්චාද් උපාධිධාරීන් පිටවීම

| පීඨය | අධ්‍යයනාංශය | පාඨමාලා | ශිෂ්‍ය සංඛ්‍යාව | | | 2013 වසරේ උපාධි ලැබූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 10 | 22 | 563 | 2208 | 2771 | **649** |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 8 | 8 | 736 | 1013 | 1749 | **360** |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 12 | 12 | 2204 | 2589 | 4793 | **1073** |
| වෛද්‍ය විද්‍යා පීඨය | 16 | 5 | | | 1061 | **71** |
| | | | | | **10374** | 2153 |
| පශ්චාද් උපාධි අධ්‍යයන | | 39 | | | 1892 | 228 |
| බාහිර විභාග | | 4 | | | 127491* | - |

බාහිර විභාග පිළිබඳ මුලු ශිෂ්‍ය සංඛ්‍යාව 2004 වර්ෂයේ සිට ලියාපදිංචි අළුත් කිරීම් සහ නව ලියාපදිංචි ඇතුලත් වේ.

# 2013 වසරේ උපාධිදාරීන් ගේ සංෂිප්තය

| පීඨය | ප්‍රථම පන්තිය | දෙවන පෙළ ඉහල | දෙවන පෙළ පහල | සාමාන්‍ය සමර්ථ | සමත්වූ සම්පූර්ණ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | 78 | 306 | 173 | 92 | 649 |
| ව්‍යවහාරික විද්‍යා | 74 | 115 | 55 | 55 | 360 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා | 77 | 281 | 437 | 441 | 1073 |
| වෛද්‍ය විද්‍යා | | 4 | 6 | 61 | 71 |
| | 229 | 706 | 671 | 649 | 2153 |



## ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගනුම් ක්‍රම

පීඨ මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රම සහ ප්‍රතිඵල පදනම් ඉගෙනුම් ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ගයන් රැසක් ගන්නා ලදි. මේ අතරින් එකක් ලෙස Learning Management System (LMS) එක ක්‍රියාවට නැංවීම සහ දැනුවත් කිරීම සඳහා පීඨයේ ආචාර්යවරුන්ට සහ ශිෂ්‍යයන් හට වැඩමුළු පවත්වන ලදි.

## ප්‍රායෝගික වැදගත්කම් සහිත විෂය ඒකක හඳුන්වාදීම

ප්‍රායෝගික වැදගත් කම් සහිත විෂය ඒකක හඳුන්වාදීම සහ මෘදුක කුසලතා වර්ධනය වන ආකාරයේ ඇගයීම් ක්‍රම හඳුන්වා දීමට විෂයමාලා සංශෝධනයක් සිදුකිරීම සඳහා පීඨයේ තීරණයක් ගන්නා ලදි. ඒ යටතේ වර්ධනය කිරීමට අවශ්‍ය අංශ ලෙසට නව මුහුණුවරකින් ස්වාධීනව කටයුතු කිරීමේ හැකියාවල නම්‍යශීලිත්වය නව තත්වයන්ට හුරුවීමේ හැකියාවල වගකීම් දැරීමල තීරණ ගැනීම සහ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාවන්ය. මෙමගින් වර්ධනය කිරීමට අපේක්ෂිත මෘදුක කුසලතා වන්නේ සන්නිවේදන හැකියාවල කණ්ඩායම් හැගීවල දීර්ඝ කාලීන ඉගෙන ගැනීම සහ දත්ත කළමනාකරණය, ව්‍යවසායකත්වය සහ නායකත්වය ගැනීම වැනි මෘදුක කුසලතා වේ.

ඉහත අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා අඛණ්ඩ ඇගයීම් ක්‍රම හඳුන්වා දීමේදී සුදුසු විෂය ඒකක සඳහා වාර්තා ඉදිරිපත් කිරීම හෝ මධ්‍ය වාර පරීක්ෂණ වලට අමතරව කණ්ඩායම් ක්‍රියාකාරකම්ල ආයතනික පුහුණුව ලබාදීමල සම්මන්ත්‍රණ ආකාරයේ ඉදිරිපත් කිරීම් දිරිගැන්වීමල ව්‍යාපෘති සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම යනාදි අංශ වර්ධනය කිරීමට හැකි අඛණ්ඩ ඇගයීම් ඇතුලත් කිරීමට කටයුතු සකස්කරමින් පවතී.

## ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල - ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම

සිව්වැදෑරුම් උපාය මාර්ගය ක්‍රියාවට නැන්වීම සඳහා යෝජිත විශ්ලේෂණාත්මක සැලැස්ම : අර්ථාන්විත ආර්ථිකයක් සහ ආයතනික ආධිපත්‍යය, ප්‍රබල මානව ප්‍රාග්ධන පාදකත්වය, ක්‍රියාශීලි තොරතුරු යටිතල ව්‍යුහය සහ ක්‍රියාශීලි ජාතික නව්‍යකරණ ක්‍රමවේදය වේ.

තෘතීය අධ්‍යාපනයේ මූලික ලක්ෂණය වන්නේ, හැකියා සංවර්ධනය, ඵලදායිකත්වය සහ නම්‍යශීලි ශ්‍රම බලකායක් සහ නව්‍ය අදහස් සහ තාක්ෂණයන් නිර්මාණය කිරීමෙන්, භාවිතයට ගැනීමෙන් හා ව්‍යාප්ත කරලීමෙන් ලෝක පරිමාණ තරගකාරි ආර්ථිකයක් ඇතිකරලීමෙන් මෙම සැලැස්මට අනුබල දෙන්නේය,

වර්තමාන ගෝලීය විස්තීර්ණ පරම්පරාටන් පිළිබඳ අධ්‍යයනය, රටක් විද්‍යාත්මක ප්‍රගමනය කරා ගෙනයන බව ව්‍යාපාරයන්ට වඩා විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතනයන් පෙන්වා දී තිබෙන්නේය (Cookson 2007). ඉහළ ඉෂ්ට සිද්ධියක් සහිත තෘතීය අධ්‍යාපන ක්‍රිමයන් එනිසාම අපේක්ෂා කරනුයේ පුළුල් පරාසයක තිබෙන්නා වූ ආයතනික මාදිරීන් වටලන්නටය. එය ශ්‍රම වෙළඳපොළ විසින් ප්‍රභේදාත්මක හැකියාවන් සහිත ශ්‍රමිකයන් හා ව්‍යවසායකයින් එක්ව බිහිකරලන්නේය.

2013 ලෝක විශ්වවිද්‍යාල ස්ථානගත කිරීමේ උදෘදපැළුරසපි වාර්තාව අනුව ශ්‍රී ලංකාවේ තෘතීය අධාපනික ආයතනයන් අතරේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 3198 වන ස්ථානයේ පසු වේ.

**ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල නගර ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකායේ විශ්වවිද්‍යාල නගර ස්ථාපත කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක්, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආමාත්‍යාංශය විසින් දියත්කොට තිබේ. මෙම නව ව්‍යාපෘතිය “ විශ්වවිද්‍යාල නගර ව්‍යාපෘතිය “ ලෙස හඳුන්වනු ලබයි.

විශ්වවිද්‍යාල නගර යනු කුමක් ද?

විශ්වවිද්‍යාල නගරයක විශේධ අංගයෝ වෙත්, ඒ කරවක් ද යත්, වෘත්තීයමය අධ්‍යයන ආයතන නේවාසිකාගාර පහසුකම්. ශිෂ්‍ය සංගම්, ළමා සුරැකුම් මධ්‍යස්ථාන, ආරෝග්‍යශාලා, බැංකු, සාප්පු සංකීර්ණ, ශරීරසුවතා මධ්‍යස්ථාන, ක්‍රීඩා සංකීර්ණ, පර්යේෂණාගාර, පුස්තකාල සහ වැඩි දියුණු කරන ලද මාර්ග පද්ධති යනාදිය වේ. විශ්වවිද්‍යාල නගර ජනගහනයට හා එම නගරයේ වෙසෙන සමාන්‍ය ජන සමාජය යන දෙපිරසටම වාණිජ්‍ය හා මූල්‍ය සේවාවන් ලබා දෙන ආකාරයෙන් සාප්පු සංකීරණයක් හැඩගස්වනු ලබයි.


විශ්වවිද්‍යාලයෙහි යටිතල පහසුකම් පුළුල් කිරීම සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ට හා නගර ජන සමාජය එකට එක් කිරීම නගර ව්‍යාපෘතියේ පරමාර්ථයක් වන්නේය. එක් එක් විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධනය කිරීමේ දී , එම විශ්විද්‍යාලය හා බැඳුනු ඓතිහාසික සුවිශේෂතාවය කෙරෙහි විශේෂ අවධානය යොමු කරන බව ඔහු වැඩිදුරටත් පැවසීය.

විශ්වවිද්‍යා ප්‍රතිපාදන කොමිසම විසින් විශ්වවිද්‍යාලයීය උපකුලපති වරුන්ට යෝජනාවන් ලබාදෙන දෙස දන්වා ලිපි යොමු කර ඇති අතර ව්‍යාපෘතිය දැනටමත් ආරම්භකොට ඇතිතේය. ශ්‍රී ජයවර්ධනපුර , කොළඹ , කැලණිය හා රජරට විශ්වවිද්‍යාල ඔවුන්ගේ අපේක්ෂා අතුළත් කළ යෝජනා යවා ඇත. ව්‍යාපෘතිය සඳහා භාවිතා කිරීමට පසුගිය අයවැය මගින් රුපියල් බිලියන 1 ක මුදල් ප්‍රතිපාදන විශ්වවිද්‍යාලය වෙත ලබාදී ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ආසියානු කාලපයේ ප්‍රධාන අධ්‍යාපනික මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව ක්‍රමානුගතව පත්කරලීමයි ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් හා මනිපාල් විශ්වවිද්‍යාලයන්හි මෙම විශ්වවිද්‍යාල නගර දැකිය හැකිය.

## උපාධි ප්‍රදානෝත්සව දිනයට උපාධිදාරී රැකියා නියුක්තිය

අවසාන ප්‍රතිඵල 2013 ජුනි 24 නිකුත් කෙරුණු අතර 2013 ජූලි 11 හා 12 දිනයන්හි දී උපාධි ප්‍රදානෝත්සවය පැවැත්විනි.

| පීඨය | වලංගු දිනය | රැකියාවේ නියුක්ත % |
|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 2013.03.15 | 37.80% |
| **ව්‍යවහාරික විද්‍යා පීඨය** | 2012.12.31 | 74.20% |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 2013.01.25 | 81.70% |
| වෛද්‍ය විද්‍යා පීඨය | | |
| වෛද්‍ය විද්‍යා | 2013.06.19 | |
| හෙද (සාමාන්‍ය) | 2013.03.29 | |
| හෙද (නැවත) (Repeat) | 2013.06.07 | |
| මානව ජීව විද්‍යා | 2013.08.01 | |
| ඖෂධවේදී | 2013.12.20 | 93.30% |
| සමස්ථය | | 70.10% |


රැකියාවේ නියුක්ත %
100.00%
90.00%
80.00%
70.00%
60.00%
50.00%
40.00%
30.00%
20.00%
10.00%
0.00%
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය (FHSS)
ව්‍යවහාරික විද්‍යා පීඨය (FAS)
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය (FMSC)
වෛද්‍ය විද්‍යා පීඨය (FMS)
වෛද්‍ය විද්‍යා
හෙද (සාමාන්‍ය)
හෙද (නැවත) (Repeat)
මානව ජීව විද්‍යා
ඖෂධවේදී
රැකියාවේ නියුක්ත %

# නේවාසික පහසුකම්

## නේවාසික පහසුකම්

විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් හා සපයන ලද නේවාසික පහසුකම් පහත සඳහන් පරිදි වේ:

| පීඨය | ගැහැණු | පිරිමි | එකතුව |
|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 1408 | 350 | 1758 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 101 | 71 | 172 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 804 | 404 | 1208 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 145 | 111 | 256 |
| **එකතුව** | 2458 | 936 | 3394 |

## විශ්වවිද්‍යාල සතු නේවාසිකාගාර

| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය | **එකතුව** |
|---|---|---|---|---|
| 1355 | 831 | 154 | 152 | 2492 |

විශ්වවිද්‍යාලය මගින් නඩත්තු කරන ලද හෝ කුලී පදනම මත පවත්වගෙන යන ලද නේවාසිකාගාර හා එහි නේවාසික සිසුන් පිළිබඳ විස්තර පහත පරිදිවේ.

| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය | එකතුව |
|---|---|---|---|---|
| 403 | 377 | 18 | 104 | 902 |

නේවසික මුලු සිසුන් සංඛ්‍යාව = 2492 + 902 = 3394 *100%

= 10453

නේවසික මුලු සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය = 32%

## කාර්යමණ්ඩල සාරාංශය

### අධ්‍යයන , විධායක , අධ්‍යයන සහයක හා අනධ්‍යයන කාර්යමණ්ඩල සාරාංශය

අධ්‍යයන කාර්යමණ්ඩලය

| පීඨය | සංඛ්‍යාව |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 160 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 179 |
| කළමානාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 209 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 118 |

මාණ්ඩලික නිලධාරීන් හා අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| මණ්ඩලික නිලධාරීන් | 43 |
| අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය | 22 |

අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර

| පීඨය | සංඛ්‍යාව |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 44 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 93 |
| කළමානාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 65 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 148 |
| පශ්චාද් උපාධි අධයන පීඨය | 15 |
| අනෙක් අංශ | 394 |
| **එකතුව** | **759** |

**මේ දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගතව ඉන්නා අධ්‍යයන කාර්යමණ්ඩලය හා 2013 වසර තුළ පශ්චාද් උපාධි සුදුසුකම් සපුරා විශ්වවිද්‍යාල සේවයට වාර්තාකළ අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර වාර්තාව**

| **පීඨය** | **2013.12.31 වන විට අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගතවී සිටින අධ්‍යයන කාර්යමණ්ඩලය** | **පශ්චාද් උපාධි සුදුසුකම් සම්පූර්ණකර නැවත විශ්වවිද්‍යාල සේවයට වාර්තා කරඇති අධ්‍යයක කාර්යමණ්ඩලය (2013 වසර තුළදී)** |
|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | 18 | 03 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 17 | 01 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 36 | 04 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 06 | 03 |

## සාමාන්‍ය හැඳින්වීම

අංක 45 දරණ විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාල පනත යටතේ 1959 ජනවාරි 1 දින විද්‍යෝදය විශ්වවිද්‍යාලය පිහිටුවන ලදී. 1972 අංක 1 දරණ විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව එය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල විද්‍යෝදය මණ්ඩපය නමින් හැඳින්විණි. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධි විධාන අනුව එය නැවතත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නමින් හැඳින්විණ.

ප්‍රතිපත්ති සැලසුම්, අධ්‍යයන හා පරිපාලන ක්‍රියාවලිය, පනතේ විධිවිධාන අනුව නිල බල මණ්ඩල මගින් සිදු කෙරේ. පාලක සභාව, සනාතන සභාව, පීඨ මණ්ඩල, පශ්චාද් උපාධි අධ්‍යයන මණ්ඩල විශ්වවිද්‍යාලයේ නිල බල මණ්ඩල වේ.

විශ්වවිද්‍යාලයේ විවිධ නිලධාරින් විසින් මෙම මණ්ඩලවල තීරණ ක්‍රියාත්මක කරනු ලැබේ.

### විශ්වවිද්‍යාලයේ නිලධාරීන්

| | |
|---|---|
| කුලපති | මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි |
| උපකුලපති | ආචාර්ය එන්. එල් ඒ. කරුණාරත්න මහතා |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය | මහාචාර්ය පී. අතුකෝරල මහතා (2013.06.30 දක්වා) |
| | සී.එල්.කේ නවරත්න මහතා (2013.07.01 සිට) |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | මහාචාර්ය එස්.එස්.එල්.ඩබ්ලිව් ලියනගේ මහතා |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | මහාචාර්ය සම්පත් අමරතුංග මහතා |
| වෛද්‍ය විද්‍යා පීඨය | මහාචාර්ය ඩබ්.එම්.එම් ද සිල්වා මහතා |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | ජ්‍යේෂ්ඨ මහාචාර්ය ස්වර්ණා පියසිරි මහත්මිය |

| | |
|---|---|
| **ලේඛකාධිකාරි** | කේ.පී. බ්‍රිටෝ මහතා |
| **මූල්‍යාධිකාරි** | ඒ. අයි. එන්. පැස්කුවල් මහත්මිය |
| **පුස්තකාලයාධිකාරි** | ඩබ්ලිව්.ඩී.ඒ.එන්.ඩී.විජේසුන්දර මහත්මිය |
| **විනයාධිකාරි** | එම්. ඩබ්ලිව් ජයසුන්දර මහතා |

**පීඨවල නියෝජ්‍ය විනයාධිකාරින්**

| | |
|---|---|
| මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය | ඒ. ආර්.පි.සි. උදයකුමාර මහතා |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | මහාචාර්ය එම් එම් පත්මලාල් මහතා |
| කළමණාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යාපීඨය | |
| | එස්.එස්. නාඔටුන්න මහතා (2013.08.06 දක්වා) |
| | මහාචාර්ය ආර්.ජී ආරයවන්ස මහතා (2013.08.07 සිට) |
| වෛද්‍ය විද්‍යා පීඨය | වෛද්‍ය පී පී ආර් පෙරේරා මහතා |

විශ්විද්‍යාලයේ පාලක බල මණ්ඩලයය

**පාලක සභාව**

1985 අංක 7 දරණ විශ්වවිද්‍යාල සංශෝධන පනතින් සංශෝධනය වු 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ VII කොටසේ 44 වන ජේදය අනුව විශ්වවිද්‍යාල පාලක සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත ය.

**නිල බලයෙන්**

| | |
|---|---|
| උපකුලපති (සභාපති) | ආචාර්ය එන්.එල්.ඒ. කරුණාරත්න මහතා |
| ලේඛකාධිකාරි (ලේකම්) | කේ.පී. බ්‍රිටෝ මහතා |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය | මහාචාර්ය පී. අතුකෝරල මහතා (2013.06.30 දක්වා) |
| | සී.එල්.කේ නවරත්න මහතා (2013.07.01 සිට) |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | මහාචාර්ය එස්.එස්.එල්.ඩබ්ලිව් ලියනගේ මහතා |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | මහාචාර්ය සම්පත් අමරතුංග මහතා |
| වෛද්‍ය විද්‍යා පීඨය | මහාචාර්ය ඩබ්.එම්.එම් ද සිල්වා මහතා |
| පශ්වාද් උපාධි අධ්‍යයන පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ස්වර්ණා පියසිරි මහත්මිය |

**සනාතන සභා නියෝජිත**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා

මහාචාර්ය ඩබ්.එම්.අබේරත්න බණ්ඩාර මහතා

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත්කළ සාමාජිකයන්**

ආචාර්ය කිරින්දේ අස්සජී නාහිමි
අයිවන් පෙරේරා පියතුමා
සේවාර්ජිත මහාචාර්ය එම්.එම්. කරුණානායක මහතා
ටී. ධර්මරාජා මහතා
ආචාර්ය ආර්.එම්.කේ රත්නායක මහතා
ආචාර්ය පී කිරිවන්දෙනිය මහතා
මහින්ද රණසිංහ මහතා
සී .එන් එස් ඩබ් මැතිව් මහතා
ඩබ්.කේ.එච්.වැගපිටිය මහතා

**පාලක සභාවේ අනුකමිටු**

1. විශ්වවිද්‍යාල මුදල් හා ප්‍රාග්ධන කමිටුව
2. නිවාඩු හා ප්‍රදාන කමිටුව
3. විගණන හා කළමනාකරණ කමිටුව
4. සැලසුම් හා සංවර්ධන කමිටුව

**සනාතන සභාව**

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 46 වැනි වගන්තියෙහි සදහන් සාමාජිකයන්ගෙන් සනාතන සභාව සමන්විත වේ


**සනාතන සභාවේ අනුකමිටු**

- බාහිර උපාධි කමිටුව
- පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව
- පරිගණක කමිටුව

**රැස්වීම්**

**2013 වර්ෂය තුළ පැවැත්වූ රැස්වීම් පහත පරිදි වේ**

| | |
|---|---|
| පාලක සභා | 14 විශේෂ කමිටු 4 ක් ද ඇතුළත්ව |
| සනාතන සභා | 14 විශේෂ කමිටු 2 ක් ද ඇතුළත්ව |
| මුදල් හා ප්‍රග්ධන කමිටු | 12 |
| නිවාඩු හා ප්‍රදාන කමිටු | 11 |
| පර්යේෂණ කමිටු | 10 |
| බාහිර විභාග කමිටු | 05 |
| සැලසුම් හා සංවර්ධන කමිටු | 00 |
| විගණන හා කළමනාකරණ කමිටු | 04 |



## පරිපාලන නිලධාරීන්

ලේඛකාධිකාරී කේ.ජී.බ්‍රිටෝ මහතා යටතේ පහත සඳහන් නිලධාරීන් විසින් පරිපාලන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

නියෝජ්‍ය ලේඛකාධිකාරී

අධ්‍යයන ආයතන අංශය — එම්.ඩබ්.එස්.ද සිල්වා මෙනවිය (2013.11.12 දක්වා)
ඒ.එච්.ලියනගේ මහත්මිය (2013.11.08 සිට)වැඩ බලන

නියෝජ්‍ය ලේඛකාධිකාරී

අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු — පී.පියරත්න මහතා( 2013.03.31 දක්වා)
ඩී.ආනන්ද පෙරේරා මහතා
(2013.04.01-2013.11.12 දක්වා සේවා පැවරුම්)
ඒ.ආර්.සිරිවර්ධන මහත්මිය
(2013.11.15 සිට සේවා පැවරුම් පදනම)

නියෝජ්‍ය ලේඛකාධිකාරී පශ්චාද් උපාධි අධ්‍යායන පීඨය

ඒ.එම්.ශ්‍රියාන්ගනී මෙන්ඩිස් මෙනවිය
(2014.03.31 දක්වා)(සප්ත වාර්ෂික නිවාඩු)

කේ.ඩබ්.ඩී.ඩී.පෙරේරා මහත්මිය
(2013.04.01 – 2013.06.30 දක්වා)

අනෝමා රත්නායක මහත්මිය
(2013.07.08-2013.09.09 දක්වා)

එන්.මාතරආරච්චි මහත්මිය (2013.10.22 සිට)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, විභාග — යූ.ඩී.ඩී.එස්.ගුණසිංහ මෙනවිය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,බාහිර විභාග — එච්.කේ.එස්.ගීගනගේ මහත්මිය

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී , වෛද්‍ය විද්‍යා — එන්.මාතරආරච්චි මහත්මිය(2013.06.02 දක්වා)
එච්.පී.වෙහෙරගොඩ මහත්මිය
(2013.06.03 සිට)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,ශිෂ්‍ය සුභසාධක — කේ.පී.වයි.තුෂාරි මල්කාන්ති මහත්මිය

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, නීති හා ප්‍රලේඛන — පී.කේ.සී.සෙනරත් මහත්මිය (සප්ත වාර්ෂික නිවාඩු)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

එච්.පී.වෙහෙරගොඩ මහත්මිය ( 2013.06.02 දක්වා)
ටී.එම්.එච්.පී.කේ.ගුණතිලක මහත්මිය(2013.06.03)

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ව්‍යවහාරික විද්‍යා — ඩී.වී.කිත්සිරි මහතා (සේවා පැවරුම්)
(2013.07.31 දක්වා)

| | |
|---|---|
| | කේ.පී.වයි.ටී.මල්කාන්ති මහතා (2013.11.18 දක්වා) |
| සහකාර ලේඛකාධිකාරී, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | එස්.ඩී.ඩී.හිරන්ති මෙනවිය |
| නියෝජ්‍ය ලේඛකාධිකාරී, සාමාන්‍ය පාලන හා සේවා | ඒ.එච්.ලියනගේ මහත්මිය |
| සහකාර ලේඛකාධිකාරී,මුලධන හා සේවා | ටී.රගුනාදන් මහතා (2013.09.24 දක්වා) |
| | පී.එන්.ස්වර්ණලතා මහත්මිය (2013.09.24 සිට වැ.බ) |
| සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන පාලන අංශය | පී.එන්.ස්වර්ණලතා මහත්මිය |
| සහකාර ලේඛකාධිකාරී,පුස්තකාල සේවා | පී.එන්.ස්වර්ණලතා මහත්මිය (2013.09.30 දක්වා) |
| | කේ.ඩී.ජයනායක මහතා (2013.10.01 සිට) |
| ව්‍යාපෘති ඉංජිනේරු | ඒ.එන්.පුංචිහෙට්ටි මහතා |
| වැඩ ඉංජිනේරු (සිවිල්) | ඕ.ඒ.ඩබ්.කරුණාරත්න මහතා |

## මූල්‍ය පරිපාලන නිලධාරීන්

මූල්‍යාධිකාරි ඒ.අයි.එන්.පැස්කුවල් මහත්මියගේ අධීක්ෂණය යටතේ ද පහත සඳහන් නිලධාරීහු මූල්‍ය පරිපාලන කටයුතුවල නිරත වූහ.

| | |
|---|---|
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි | පී.ජී.මෛත්‍රිරත්න මයා (14.03.2013 දක්වා) |
| | පී.එච්.සී.එම්. හිරිපිටිය මිය (15.03.2013 සිට) |
| නියෝජ්‍ය අභ්‍යන්තර විගණක | එම්.එම්.ජේ.ආර්. බෝගමුව මයා (31.03.2013 දක්වා) |
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයෙහි ආකෘතිය පවත්නා ප්‍රථම උපාධි අධ්‍යයන පීඨයේ ආකෘතියට වඩා වෙනස් ස්වරූපයක් ගනී. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය දෙපාර්තමේන්තු වෙනුවට අධ්‍යයන මණ්ඩලයකින් සමන්විත වේ. ආරම්භක වශයෙන් අධ්‍යයන මණ්ඩල හයක් පැවති අතර සනාතන සභාවේ හා පාලක සභාවේ අනුමතිය ඇතිව 2011 දී විවිධ ක්ෂේත්‍රවලින් වෘත්තීය සුදුසුකම් ඇති බහු විෂයීයක අධ්‍යයන කේෂේත්‍ර පදනම් කරගත් නව අධ්‍යයන මණ්ඩලයක් පත් කරන ලදි. ඒඅනුව පීඨයෙහි පවත්නා අධ්‍යයන මණ්ඩල හත පහතින් දැක්වේ.

1. මානව ශාස්ත්‍ර
2. සමාජීය විද්‍යා
3. කළමනාකරණ හා වාණිජ විද්‍යා
4. ජෛවීය විද්‍යා
5. භෞතිය විද්‍යා
6. වෛද්‍ය විද්‍යා
7. බහුවිෂයික අධ්‍යයන මණ්ඩලය යනුවෙනි.

විවිධ අධ්‍යයන ක්ෂේත්‍රයන් ඔස්සේ විවිධ පීඨයන් හතරකගෙන් පුහුණුවීම් ලද විද්වතුන්ගේ සම්මිශ්‍රණයකින් සැදුම්ලත් අධ්‍යයන මණ්ඩලයකින් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සමන්විත වන බැවින් එකී අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය අතුරින් බහුවිෂයියක පර්යේෂණ කාර්යයන් ආරම්භ කිරීමට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය අරමුණු කරයි.

සෑම අධ්‍යයන මණ්ඩලයකම මුලසුන හොබවනු ලබන්නේ වෘත්තිමය ඥණශක්තිය අතින් ඉතා ඉහළ මට්ටමකින් හෙබි කාර්යශූර ජ්‍යෙෂ්ඨ විද්වතෙකු විසිනි. පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා සම්බන්ධීකාරකයෙකු ලෙස සිය සේවාවන් සපයනු ලබන්නාවූ ද පර්යේෂණ කටයුතුවල දී මෙන්ම පශ්චාද් උපාධි අධීක්ෂණ කාර්යයන්හි දී ක්‍රියාකාරී ලෙස සහසම්බන්ධ වන්නා වූ විශ්වවිද්‍යාලීය අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සාමාජිකයන්, අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් වේ.

ඉහත මණ්ඩල හතේ දී ගනු ලබන තීරණ සනාතන සභාවේ අනුමතියට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සඳහා වැඩිදුරටත් සලකා බැලීම සඳහා පීඨාධිපති විසින් මුලසුන දරන පීඨ මණ්ඩල රැස්වීම් වලදී තවදුරටත් සාකච්ඡා කරනු ලැබේ.

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ මණ්ඩලය සියලු සිව් පීඨයන්හි පීඨාධිපතිවරුන්ගෙන් ද නම්කරන ලද සනාතන සභාවේ සභිකයන් තිදෙනෙකුගෙන් ද නම්කරන ලද පාලක සභාවේ තිදෙනෙකුගෙන් ද කැඳවන ලද සාමාජිකයන් ලෙස අධ්‍යයන මණ්ඩල හතෙහි සභාපතිවරුන්ගෙන් ද සමන්විත වේ. නම් වශයෙන් "පර්යේෂණ උපාධි " (දර්ශනශූරි,

දර්ශනපති, ශාස්ත්‍රපති හා විද්‍යාපති උපාධි) හා පර්යේෂණ උපාංගයක් ඇතුළත් "උපාධි" වශයෙන් ප්‍රධාන වර්ගයේ උපාධි වැඩසටහන් දෙකක් පීඨය මඟින් පිරිනමනු ලබයි.

දේශන, අවශ්‍ය ප්‍රායෝගික පුහුණුවීම්, කාර්මික පුහුණුවීම් හා විශේෂිත අංශයන්හි සිදුකරන ක්ෂේත්‍ර අධ්‍යයන මඟින් අයදුම්කරුවාට අවශ්‍ය සංකල්පීය පසුබිමක් ඔස්සේ උපදිෂ්ට උපාධි සහ පර්යේෂණ උපාංග ලබාදීමට සැලසුම් සකස්කර දී තිබේ. මෙම වැඩසටහන් මට්ටම් දෙකකින් පිරිනමනු ලබන අතර නම් වශයෙන් පශ්චාද් ඩිප්ලෝමා මට්ටම හෝ විද්‍යාපති, ව්‍යාපාර පරිපාලනවේදී, රාජ්‍ය කළමනාකරණවේදි, හෝ ශාස්ත්‍රපති උපාධිය වශයෙනි. ඇතැම් වැඩසටහන්වලදී පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ සිට ශාස්ත්‍රපති උපාධි මට්ටම දක්වා උසස් අධ්‍යාපන මට්ටමකට ඉදිරියට යාමේ හැකියාව පවතී.

බහු විෂයික අධ්‍යයන මණ්ඩලය විසින් දර්ශනසූරී උපාධියට පෙනී සිටින සිසුන් සඳහා අනිවාර්ය පාඨමාලා ඒකකයන් මෑතක දී ආරම්භකරන ලදි. මෙම අධ්‍යයන මණ්ඩලයේ ලියාපදිංචි වන සිසුන් ඔවුන්ගේ පළමු වසර තුළ දී මෙම පාඨමාලාවෙහි එක් කොටසක් සම්පූර්ණ කළ යුතු අතර එය දර්ශනපති මට්ටමේ සිට දර්ශනසූරී මට්ටම දක්වා උසස්කිරීමට සුදුසුකමක්වේ. එමෙන්ම කළමනාකරණ අධ්‍යයන මණ්ඩලය නව දර්ශනසූරී වැඩසටහනක් ආරම්භකර ඇති අතර දර්ශනසූරී වැඩ සටහන සඳහා ලියාපදිංචි අයදුම්කරුවන් ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර එක් අවුරුදු වැඩ සටහනක් ද හැදෑරිය යුතුය. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය 1996 සිට 2013 දක්වා දර්ශනසූරී උපාධි 84, දර්ශනපති උපාධි 132, ශාස්ත්‍රපති උපාධි 189, විද්‍යාපති උපාධි 1252ක් වශයෙන් පශ්චාද් උපාධි ඩිප්ලෝමා පිරිනමා ඇති අතර පශ්චාද් උපාධි සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙහි කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබේ. නව ආරම්භක පියවරක් ලෙස පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය ක්‍රමෝපායන විද්‍යාවන් සහසමාජ සංගතිය පිළිබඳ විද්‍යාපති උපාධිය හා විද්‍යා පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලෙස නම් වශයෙන් 2014 දී නව විද්‍යා උපාධි වැඩ සටහන් පිරිනැමීමට සැලසුම්කර තිබේ. ඊට අමතරව සම්මාන අගයන් හුවමාරු කළ හැකි පරිදි විදේශීය සිසුන් සඳහා ජාත්‍යන්තර පශ්චාද් උපාධි පුහුණු වැඩසටහනක් පිරිනැමීමට අපේක්ෂා කෙරේ.

පීඨයේ සියලු ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු පීඨයේ වෙබ් පිටුවෙන් සපයනු ලබනු අතර අන්තර්ජාල පහසුකම් ඔස්සේ අයදුම්කරුවාට අවශ්‍ය සියලු තොරතුරු ලබාගැනීමටත් ඉතා කාර්යක්ෂම ලෙස ඔවුනට තීරණවලට එළඹීමටත් එය උපකාරී වේ. නිරන්තරයෙන් පීඨ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සඳහා කාර්යය මණ්ඩල සමාජිකයෙකු පුහුණු කළ යුතුය. පීඨයෙහි දත්ත ගබඩා කිරීමේ කාර්යය දැනටමත් වැඩිදියුණුකර ඇති අතර එම දත්ත මඟින් විවිධ වැඩසටහන් සඳහා අයදුම්කරුවන් ලියාපදිංචිකිරීම වෙනුවෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීමට එයින් අපේක්ෂා කෙරේ.

ඉදිරි පස් වසර තුළ දී පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ අභිවෘද්ධිය වෙනුවෙන් එහි වර්තමාන තත්ත්වයේ සිට උපාධි අධ්‍යයන මට්ටමක් දක්වා ශක්තිමත් ආරම්භයක් ගැනීමට අපේක්ෂා කෙරේ. සියලුම පීඨයන්හි ක්‍රියාකාරකම් මෙහෙයවීමට අනුකූලව විශාල පරිපාලනමය හා මූල්‍යමය සවයං පාලනයක් ඇති පශ්චාද් උපාධි විද්‍යායතනයක් ඇතිකිරීමට අපේක්ෂාකෙරේ. මේ ගමන් මඟ 2014 දී ආරම්භකර ඉන් ඉදිරියට 2020 වසර අවසානයේදී එහි ඵලදායී මට්ටමකට ළඟාවීමට අවශ්‍ය පියවරයන් ගනු ලැබේ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් පිරිනමනු ලබන උපාධි පහත සඳහන් වේ.**

| | අධ්‍යයන මණ්ඩලයේ නාමාවලිය | උපාධි වැඩසටහන් |
|---|---|---|
| 1 | මානව ශාස්ත්‍ර | සිංහල, ජනසංනිවේදනය, සංස්කෘතික අධ්‍යයනය, සංස්කෘත, බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ දර්ශනය, පාලි පිළිබඳ දර්ශනසූරී උපාධිය |
| | | සිංහල, ජනසංනිවේදනය, සංස්කෘතික අධ්‍යයනය, සංස්කෘත, බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ දර්ශනය, පාලි පිළිබඳ දර්ශනපති උපාධිය |
| | | සිංහල, ජනසංනිවේදනය, සංස්කෘතික අධ්‍යයනය, සංස්කෘත, බෞද්ධ ශිෂ්ටාචාරය, බෞද්ධ දර්ශනය, පාලි පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය |
| | | ලේඛකත්ව හා ජනසන්නිවේදන පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය. |
| | | (හඳුන්වාදීමට නියමිත) නාට්‍ය හා රංග කලාව පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව |
| 2 | සමාජීය විද්‍යා | ඉතිහාසය, පුරාවිද්‍යාව, භූගෝල විද්‍යාව, මානව විද්‍යාව, සමාජ විද්‍යාව, අපරාධ විද්‍යාව, ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනසූරී උපාධිය |
| | | ඉතිහාසය, පුරාවිද්‍යාව, භූගෝල විද්‍යාව, මානව විද්‍යාව, සමාජවිද්‍යාව, අපරාධ විද්‍යාව, ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය |
| | | ඉතිහාසය, පුරාවිද්‍යාව, භූගෝල විද්‍යාව, මානව විද්‍යාව, සමාජවිද්‍යාව, ආර්ථික විද්‍යාව, අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය |
| | | අපරාධවිද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය |
| | | සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය |
| 3 | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා | කළමනාකරණය පිළිබඳව දර්ශනසූරී උපාධිය |
| | | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය (MBA) |
| | | රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (MPM) |
| | | කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය. |
| | | ව්‍යවහාර මූල්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය MSc App Fin) |
| | | දේපල කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳව පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය/විද්‍යාපති උපාධිය ( REMV) |
| | | අලෙවි කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය |
| | | ව්‍යවහාර මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය (PGD App Fin) |
| | | ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය |
| | | ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය/ ව්‍යාවසායකත්ව ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ විද්‍යාපති |

| | | |
|---|---|---|
| 4 | භෞතික විද්‍යා | ගණිතය, භෞතිකවිද්‍යාව, රසායන විද්‍යාව, සංඛ්‍යානය පිළිබඳ දර්ශනසූරි උපාධිය. |
| | | ගණිතය, භෞතිකවිද්‍යාව, රසායන විද්‍යාව, සංඛ්‍යානය පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය |
| | | බහු අවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය. |
| | | විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය |
| | | පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය. |
| | | කාර්මික ගණිතය පිළිබඳ පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය /විද්‍යාපති උපාධිය |
| | | ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය/ විද්‍යාපති උපාධිය |
| | | භෞතික අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය/ විද්‍යාපති උපාධිය |
| 5 | ජීවී විද්‍යාව | උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, වන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ආහාර විද්‍යාව, පිළිබඳ දර්ශනසූරි උපාධිය. |
| | | උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, වන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, (ආහාර) පෝෂණ විද්‍යාව, පිළිබඳ දර්ශනපති උපාධිය |
| | | වන විද්‍යාව හා පාරිසරික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය. |
| | | ඖෂධ ශාක සහ සගන්ධ ශාකවල කාර්මික භාවිතය පිළිබඳ විද්‍යාපති උපාධිය. |
| | | මත්ස්‍ය හා ජලජීවී පිළිබඳ විද්‍යාපති උපාධිය. |
| | | ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය. |
| | | ශාකමය නිෂ්පාදනයන්හි විද්‍යා හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය ( හඳුන්වාදීමට නියමිත) |
| 6 | වෛද්‍ය විද්‍යාව | ව්‍යුහ විද්‍යාව, කායික විද්‍යාව, පරපෝෂිත විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ඖෂධ විද්‍යාව, ව්‍යවහාරික විද්‍යාව, ප්‍රජා වෛද්‍ය විද්‍යාව, සායනික වෛද්‍ය විද්‍යාව, ශල්‍යවෛද්‍ය විද්‍යාව, ළමා රෝග පිළිබඳ විද්‍යාව, ප්‍රසව හා නාරිවේදය, වෛද්‍ය අධ්‍යාපනය හා සෞඛ්‍යය, ජෛව රසායන විද්‍යාව, පිළිබඳ දර්ශනසූරි උපාධිය |
| | | ව්‍යුහ විද්‍යාව, කායික විද්‍යාව, පරපෝෂිත විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, ඖෂධ විද්‍යාව, වෝහාරික විද්‍යාව, ප්‍රජා වෛද්‍ය විද්‍යාව, සායනික වෛද්‍ය විද්‍යාව, ශල්‍ය වෛද්‍ය විද්‍යාව, ළමා රෝග පිළිබඳ විද්‍යාව, ප්‍රසව හා නාරිවේදය, වෛද්‍ය අධ්‍යාපනය හා සෞඛ්‍යය, ජෛව රසායන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය |
| 7 | බහු විෂයික විද්‍යා | භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධතිය හා දුරස්ථ සංවේදනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව<br><br>ක්‍රමෝපායන විද්‍යාවන් හා සමාජ සංහිඳියාව (හඳුන්වාදීමට නියමිත)<br><br>විද්‍යාත්මක පරිපාලනය (හඳුන්වාදීමට නියමිත) |

2013 වසරේ දී පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සතු සම්පත් හා සිසුන් පිළිබඳ විස්තර.

| අධ්‍යයන මණ්ඩලය | වැඩ සටහන | මුළු සිසුන් සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය (අධීක්ෂණ |
|---|---|---|---|
| මානව ශාස්ත්‍ර | සිංහල පිළිබඳ දර්ශනසූරි උපාධිය | 03 | 05 |
| | ජනසංනිවේදනය පිළිබඳ දර්ශනසූරී උපාධිය | | |
| | සංස්කෘතික අධ්‍යයනය පිළිබඳ දර්ශනසූරි උපාධිය | 02 | 02 |
| | සංස්කෘත පිළිබඳ දර්ශනසූරි උපාධිය | | |
| | බෞද්ධ ශිෂ්ටාචාරය, පිළිබඳ දර්ශනසූරි උපාධිය | 01 | 02 |
| | බෞද්ධ දර්ශනය, පිළිබඳ දර්ශනසූරි උපාධිය | | |
| | දර්ශනය පිළිබඳ දර්ශනසූරි උපාධිය | 01 | 02 |
| | පාලි පිළිබඳ දර්ශනසූරි උපාධිය | | |
| | සිංහල පිළිබඳ දර්ශනපති උපාධිය | 08 | 05 |
| | ජනසංනිවේදනය පිළිබඳ දර්ශනපති උපාධිය | 12 | 03 |
| | සංස්කෘතික අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධිය | 17 | 05 |
| | සංස්කෘත පිළිබඳ දර්ශනපති උපාධිය | 05 | 04 |
| | හින්දි භාෂාව පිළබඳ දර්ශනපති උපාධිය | 04 | 02 |
| | බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ දර්ශනපති උපාධිය | 08 | 04 |
| | බෞද්ධ දර්ශනය පිළිබඳ දර්ශනපති උපාධිය | 05 | 04 |
| | දර්ශනය පිළිබඳ දර්ශනපති උපාධිය | 07 | 02 |
| | පාලි පිළිබඳ දර්ශනපති උපාධිය | 07 | 02 |
| | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දර්ශනපති උපාධිය | 01 | |
| | සිංහල භාෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මඟින්) | 17 | 05 |
| | සංස්කෘතික අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මඟින්) | 16 | 06 |
| | සංස්කෘත පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මඟින්) | 02 | 04 |
| | බෞද්ධ ශිෂ්ටාචාරය, පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය. (පර්යේෂණ මඟින්) | 05 | 04 |
| | බෞද්ධ දර්ශනය, පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය. (පර්යේෂණ මඟින්) | 05 | 04 |
| | දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මඟින්) | 20 | 06 |
| | පාලි පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මඟින්) | | |
| | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මඟින්) | 01 | |
| | සිංහල භාෂාව පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | 07 | 04 |
| | ජනසංනිවේදනය පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | | |
| | රංග කලාව හා වේදිකා නාට්‍ය පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | | |
| | සංස්කෘතික අධ්‍යයනය පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | 01 | 04 |
| | සංස්කෘත පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය. | | |
| | බෞද්ධ ශිෂ්ටාචාරය, පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | | |
| | බෞද්ධ දර්ශනය, පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | 02 | 04 |
| | දර්ශනය, පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | 01 | 04 |
| | පාලි පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | | |

| | | | |
|---|---|---|---|
| | ලේඛකත්ව හා ජනසන්නිවේදන ය පිළිබඳ පශ්වාද් උපාධි ඩිප්ලෝමාව | 153 | 12 |
| | සිංහල භාෂාව පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 11 | 04 |
| | සංස්කෘතික අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 05 | 04 |
| | සංස්කෘත පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 01 | |
| | බෞද්ධ ශිෂ්ටාචාරය, පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 05 | 04 |
| | බෞද්ධ දර්ශනය, පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 01 | |
| | දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 16 | 04 |
| | පාලි පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 01 | |
| | **අනු එකතුව** | **351** | **115** |
| සමාජීය විද්‍යාව | ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනසූරී උපාධිය | | |
| | ඉතිහාසය පිළිබඳ දර්ශනසූරී උපාධිය | | |
| | අපරාධ විද්‍යාව පිළිබඳ දර්ශනසූරී උපාධිය | **02** | **02** |
| | පුරාවිද්‍යාව පිළිබඳ දර්ශනසූරී උපාධිය | | |
| | මානව විද්‍යාව පිළිබඳ දර්ශනසූරී උපාධිය | | |
| | සමාජීය විද්‍යාව පිළිබඳ දර්ශනසූරී උපාධිය | 01 | 01 |
| | භූගෝලවිද්‍යාව පිළිබඳ දර්ශනසූරී උපාධිය | 02 | 01 |
| | පුරාවිද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 04 | 03 |
| | ඉතිහාසය පිළිබඳ දර්ශනපති උපාධිය | 09 | 05 |
| | අපරාධ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 04 | 03 |
| | දේශපාලන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 03 | 02 |
| | ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 05 | 03 |
| | භූගෝලවිද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 01 | |
| | මානව විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 01 | |
| | සමාජීය විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 11 | 09 |
| | අපරාධ විද්‍යාව පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | **42** | 06 |
| | භූගෝලවිද්‍යාව පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 10 | 05 |
| | පුරාවිද්‍යාව පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 09 | 05 |
| | සමාජීය විද්‍යාව පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 23 | 15 |
| | අපරාධ විද්‍යාව පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 18 | 10 |
| | දේශපාලන විද්‍යාව පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති | 04 | |
| | ඉතිහාසය පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති | 09 | 05 |
| | ආර්ථික විද්‍යාව පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති | 06 | 03 |
| | සමාජීය විද්‍යාව පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති ගුරු උපාධිය | 26 | 06 |
| | සමාජීය විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 22 | 06 |
| | දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 06 | 04 |
| | ඉතිහාසය හා පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති යෝග්‍යතා උපාධිය | 04 | 04 |
| | සමාජීය විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය | 29 | 06 |
| | අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය | 90 | 06 |
| | අනු එකතුව | **341** | **110** |

| | | | |
|---|---|---|---|
| කළමනාකරණ අධ්‍යයන හා | කළමනාකරණය පිළිබඳ දර්ශනසූරී උපාධිය | 06 | |
| | මූල්‍ය ව්‍යවහාරය පිළිබඳ පශ්චාත් උපාධි අභිඥාන පත්‍රය | 84 | 14 |

| | | | |
|---|---|---|---|
| වාණිජ විද්‍යා | ව්‍යවසාය ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය | 28 | 12 |
| | කළමනාකරණ වැඩ සටහන් පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති/රාජ්‍යකළමනාකරණපති/විද්‍යාපති උපාධිය | 647 | 25 |
| | අලෙවි කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය | 141 | 10 |
| | නිශ්චල දේපළ හා තක්සේරුකිරීම පිළිබඳ විද්‍යාපති උපාධිය | 137 | 10 |
| | අනු එකතුව | **1043** | **71** |
| භෞතික විද්‍යාව | රසායන විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 04 | 04 |
| | බහු අවයවක විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 01 | 02 |
| | භෞතික විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 01 | 02 |
| | භෞතික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 02 | 02 |
| | ගණිතමය භෞතික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය. | 05 | 03 |
| | රසායන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 06 | 06 |
| | පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 06 | 03 |
| | සංඛ්‍යානය පිළිබඳ දර්ශනපති උපාධිය | 02 | 04 |
| | බහු අවයවක විද්‍යාවන් හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 48 | 28 |
| | ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති/පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය | 15 | 16 |
| | කාර්මික ගණිතය පිළිබඳ විද්‍යාපති/පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය | 24 | 16 |
| | භෞතික විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති/පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය | 18 | 12 |
| | පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 40 | |
| | බහු අවයවක විද්‍යාවන් හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 27 | |
| | කාර්මික විශ්ලේෂී රසායන විද්‍යාව පිළිබඳ ව පශ්චාද් උපාධි අභිඥාන පත්‍රය /විද්‍යාපති උපාධිය. | 37 | |
| | අනු එකතුව | 236 | 98 |
| | | | |
| ජෛව විද්‍යා | උද්භිද විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 04 | 04 |
| | වන විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 05 | 03 |
| | රසායන විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 03 | 06 |
| | පෝෂණ විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 09 | 06 |
| | සත්ත්ව විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 03 | 02 |
| | වන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 04 | 04 |
| | උද්භිද විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 08 | 08 |
| | රසායන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 04 | 04 |
| | සත්ත්ව විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 06 | 05 |
| | ආහාර විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 07 | 04 |
| | ආහාර විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 66 | 19 |
| | වන හා පරිසර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 50 | 09 |
| | ඖෂධීය හා සගන්ධ ශාක කර්මාන්තයන්හි භාවිතය පිළිබඳ විද්‍යාපති උපාධිය | 14 | 10 |
| | ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ | 14 | 10 |

| | | | |
|---|---|---|---|
| | විද්‍යාපති උපාධිය. | | |
| | **අනු එකතුව** | **197** | **94** |
| වෛද්‍ය විද්‍යා | ජෛව රසායන විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 04 | 01 |
| | වෛද්‍ය අධ්‍යාපනය හා සෞඛ්‍ය පිළිබඳ දර්ශනසූරි උපාධිය | 04 | |
| | ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනසූරි උපාධිය | 01 | |
| | ළමා රෝග පිළිබඳ දර්ශනපති උපාධිය | 01 | 02 |
| | වෛද්‍ය අධ්‍යාපනය හා සෞඛ්‍ය පිළිබඳ දර්ශනපති උපාධිය | 03 | 06 |
| | ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 02 | |
| | ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 04 | 03 |
| | ඖෂධ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 03 | |
| | ව්‍යුහ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 02 | 03 |
| | ජෛව රසායන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 08 | 07 |
| | **අනු එකතුව** | **32** | **22** |
| | | | |
| | දර්ශනසූරි උපාධි | 07 | 02 |
| | දර්ශනපති උපාධි | 03 | 02 |
| | භූගෝලීය තොරතුරු හා දුරස්ත සංවේදනය පිළිබඳ විද්‍යාපති උපාධි | 49 | |
| | අනු එකතුව | 59 | 04 |
| | **මුළු එකතුව** | **2259** | **416** |

## අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර

| පීඨය | ජ්‍යෝෂ්ඨතම | ජ්‍යෝෂ්ඨ | ආධුනික | කනිෂ්ඨ | එකතුව |
|---|---|---|---|---|---|
| පශ්චාත් උපාධි පීඨය | 00 | 04 | 07 | 04 | **15** |

## සිසුන් අතුල් කිරීම

2012/ 2013 අධ්‍යයන වර්ෂ ආරම්භ සහ අවසානය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| පීඨය | අධ්‍යයන වර්ෂය ආරම්භ වන දිනය | අධ්‍යයන වර්ෂය අවසාන වන දිනය |
|---|---|---|
| මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය | 2013.04.22 | 2014.03.22 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 2013.03.27 | 2014.03.26 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය | 2013.04.25 | 2014.03.10 |
| වෛද්‍යවිද්‍යා පීඨය | 2013.03.18 | 2014.08.28 (විභාග පැවැත්වූ දිනය) |

## ලියාපදිංචි කිරීම පිළිබඳ තොරතුරු

| අධ්‍යයන වර්ෂය | මානව ශාස්ත්‍ර | ව්‍යවහාරික විද්‍යා | කළමණාකරණ | වෛද්‍ය විද්‍යා | මුලු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 2006/2007 | 536 | 361 | 998 | 218 | **2113** |
| 2007/2008 | 675 | 358 | 1084 | 226 | **2343** |
| 2008/2009 | 600 | 452 | 1094 | 246 | **2392** |
| 2009/2010 | 674 | 465 | 1166 | 228 | **2533** |
| 2010/2011 | 683 | 631 | 1199 | 225 | **2738** |
| 2011/2013 | 998 | 664 | 1409 | 180 | **3251** |

2013 වසරේ විවිධ පීඨ අනුව මහපොල ශිෂ්‍යත්ව ලැබූ ශිෂ්‍ය ලේඛනය පහත දැක්වේ.
කුශලතා ශිෂ්‍යත්ව සඳහා රු. 2200/- බැගින් සහ සාමාන්‍ය මහපොල ශිෂ්‍යත්ව සඳහා රු. 2150/- බැගින් ගෙවන ලද අතර මෙම ශිෂ්‍යත්ව සඳහා රු. 350 බැගින් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවන ලදී.

## ශිෂ්‍යාධාර

**2013 වසරේ ගෙවන ලද ශිෂ්‍යාධාර පහත දැක්වේ. (පීඨ හා අධ්‍යයන හා අධ්‍යයන වර්ෂ අනුව)**

| අධ්‍යයන වර්ෂය | මානව ශාස්ත්‍ර | කළමනාකරණ | වෛද්‍ය විද්‍යාව | ව්‍යවහාරික විද්‍යා | වර්ෂය සඳහා ගෙවන මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|
| 2007/2008 | 234 | 704 | 68 | - | 4,296,256.00 |
| 2008/2009 | 342 | 788 | 106 | 68 | 30,221,900.00 |
| 2009/2010 | 387 | 840 | 98 | 172 | 35,667,600.00 |
| 2010/2011 | 452 | 1010 | 118 | 183 | 33,333,400.00 |
| එකතුව | | | | | 103,519,156.00 |

| අධ්‍යයන වර්ෂය | මානව ශාස්ත්‍ර | කළමනාකරණ | වෛද්‍ය විද්‍යා | ව්‍යවහාරික විද්‍යා | වර්ෂය සඳහා ගෙවන **ලද ශිෂ්‍යාධාර** මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|
| 2007/2008 | | | 6 | | 101,500.00 |
| 2008/2009 | 125 | 93 | 12 | 11 | 4,591,800.00 |
| 2009/2010 | 167 | 90 | 10 | 53 | 5,831,200.00 |
| 2010/2011 | 85 | 72 | 8 | 54 | 4,188,000.00 |
| **එකතුව** | **377** | **255** | **36** | **118** | **14,712,500.00** |

# විභාග අංශය

**විභාග කටයුතු:**

2013 වර්ෂය තුළ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා සහ ව්‍යවහාරිකවිද්‍යා යන පීඨවල විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම, පැකට් කිරීම සහ නියමිත විභාග පැවැත්වෙන දිනවල දී ප්‍රශ්න පත්‍ර පැකට් ශාලාධිපතිවරුන් වෙත භාර දීම සම්පූර්ණයෙන්ම විභාග අංශය මගින් සිදු කරන ලදී. කළමනාකරණ අධ්‍යයන සහ වාණිජවිද්‍යා පීඨයේ පිළිතුරු පත්‍ර පැකට් අදාළ පරීක්ෂකවරුන් වෙත භාරදීම, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ විභාග ප්‍රශ්න පත්‍රවලින් වැඩි ප්‍රමාණයක් යතුරු ලියනය කිරීම ද විභාග අංශය මගින් සිදු කරන ලදී. ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ උපාධිලාභී සිසුන්ගේ සමත් ලේඛන සැකසීම හා මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයේ බාහිර ප්‍රථම පරීක්ෂණය සමත් ගුරුවරුන්ගේ සමත් ලේඛන සැකසීම ද එම ලේඛන පාලක සභා අනුමැතිය සඳහා සනාතන සභාවට යොමු කිරීම ද විභාග අංශය මගින් සිදු කරන ලදී.

මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨයේ විභාග රාජකාරි කටයුතුවල නියැලුණු ආචාර්ය මණ්ඩලයේ විභාග ගෙවීම් වවුචර්පත් පරීක්ෂා කිරීම ද, ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ ආචාර්ය මණ්ඩලයේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවක භවතුන්ගේ විභාග ගෙවීම් වවචර්පත් පරීක්ෂා කිරීම ද විභාග අංශය මගින් සිදු කරන ලදී.

**උපාධි ප්‍රදානෝත්සව කටයුතු**

2013 ජූලි මස 11 සහ 12 යන දිනයන්හි පැවති විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවයට අදාළව මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජවිද්‍යා සහ ව්‍යවහාරිකවිද්‍යා යන පීඨවල සයලුම උපාධිලාභීන්ගේ නාම ලේඛන සකස් කිරීම සහ පාලක සභා අනුමැතිය සඳහා එම ලේඛන සනාතන සභාවට යොමු කිරීම ද විභාග අංශය මගින් සිදු කරන ලදී.

**සහතික නිකුත් කිරීම සහ සනාථ කිරීම්:**

මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජවිද්‍යා සහ ව්‍යවහාරිකවිද්‍යා යන පීඨවල සියලුම උපාධිධාරීන්ට උපාධි සහතික නිකුත් කිරීම, උපාධිධාරීන්ගේ ඉල්ලීම් අනුව විස්තරාත්මක සහ සවිස්තරාත්මක ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම සහ දේශීය හා විදේශීය ආයතනවල ඉල්ලීම් අනුව උපාධි ප්‍රතිඵල සනාථ කර යැවීමේ කටයුතු ද විභාග අංශය මගින් සිදු කරන ලදී. එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඇතුළු

විවිධ ආයතන මගින් උපාධිධාරීන්ගේ තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් කරනු ලබන විමසීම් සඳහා අවශ්‍ය පරිදි තොරතුරු ලබා දීම ද විභාග අංශය මගින් සිදු කරන ලදි.

<u>HETC ව්‍යාපෘතියට අදාළ කටයුතු</u>

මෙම ව්‍යාපෘතියට අදාළව මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජවිද්‍යා, ව්‍යවහාරික විද්‍යා සහ වෛද්‍ය විද්‍යා පීඨ සිසුන් සඳහා පැවති IT සහ English විභාග සඳහා අදාළ ලියාපදිංචි කිරීම් කටයුතු සහ විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය, පැකට් කිරීම හා බෙදා හැරීම් ආදී සියලු කටයුතු විභාග අංශය මගින් සිදු කරන ලදි.

# විශ්වවිද්‍යායීය වෛද්‍ය මධ්‍යස්ථානය

ප්‍රධාන වශයෙන් සිසුන්ගේ සහ කාර්යමණ්ඩලයේ වෛද්‍ය ප්‍රතිකාර වෛද්‍ය පරීක්ෂණ වාර්තා සහ දන්ත ශල්‍යා සේවා ඉටුකරන ලදී. මීට අමතරව ඩෙංගු මර්ධන වැඩසටහන් කෘමි නාශක දියර ඉසීම් ශිෂ්‍යා නේවාසිකාගාර සහ ආපන ශාලා වල ආහාර පරීක්ෂා කිරීම් විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩල සඳහා අවබෝධතා ක්‍රම සහ සෞඛ්‍ය හා සමාජීය ගැටළු පිළිබඳ වෛද්‍ය සායන ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රධාන වෛද්‍ය නිලධාරී වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි මහතා නව විශ්වවිද්‍යාල ප්‍රවේශයන් සඳහා වූ පුහුණු පාඨමාලා සම්පත් දායක ලෙසට ක්‍රියාකරනු ලැබීය.

2013 වර්ෂයේ වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි මහතා ප්‍රධාන වෛද්‍ය නිරධාරී ලෙසටත්වෛද්‍ය එස් ගුණසේකර මහත්මිය සහ වෛද්‍ය ඩී.එම්.එල්.ආර්.එම්.පෙරේරා මහත්මිය වෛද්‍ය නිලධාරීන් ලෙසටත් වෛද්‍ය එච්.විජේසිංහ දන්ත ශල්‍යා වෛද්‍යවරයා ලෙසත් සේවය කර ඇත.

# ශාරීරික අධ්‍යාපන අංශය

විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ ශාරීරික අධ්‍යාපන කටයුතු අන්තර් විශ්වවිද්‍යාල ජාතික හා අන්තර්ජාතික ක්‍රීඩා කටයුතු මෙම අංශය මගින් සිදු කෙරේ. 2013 වර්ෂය තුළ ටී.එස්.ඒ.අමරසේන මහතා වැඩ බලන ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇත.

i. ශා.අ. උපදේශිකා තමරා ජයසේකර මිය
ii. ලාල් චන්ද්‍රකුමාර මහතා
iii. ශා.අ. උපදේශිකා නිශාන්ති විදානගේ මිය
iv. ශා.අ. උපදේශිකා රමණී කුලතිලක මිය

**2012/2013 - ක්‍රීඩා උපදේශක මණ්ඩලය**

එක් පීඨයකින් දෙදෙනෙකු බැගින් අධ්‍යයන කාර්යය මණ්ඩලයේ මහත්ම මහත්මීන් 08 දෙනෙකුන්ගෙන්ද, නිල බලයෙන් පත්කරන ලද නිලධාරි මහත්ම මහත්මීන් 10 දෙනෙකුගෙන්ද ක්‍රීඩා උපදේශක මණ්ඩලය සමන්විතය.

වර්තමාන සභාපති : වෛද්‍ය රසික පෙරේරා මයා.

විධායක ලේකම් : ටී.එස්.ඒ.අමරසේන මයා.

01 **වර්ෂය තුළ ශාරීරික අධ්‍යාපන අංශය විසින් සංවිධානය කර පවත්වන ලද ක්‍රීඩා තරඟාවලින්**

- 2013.06.16 වන දින පැවත්වූ වාර්ෂික විවෘත මාර්ග ධාවන තරඟය.
- 2013.11.06 වන දින පැවත්වූ අන්තර් පීඨ නවක හා විවෘත මලල ක්‍රීඩා තරඟාවලිය.

02 <u>2013 වර්ෂය තුල සහභාගි වූ දේශිය ක්‍රීඩා තරඟාවලින්</u>

- අප විශ්වවිද්‍යාලීය ක්‍රිකට් කණ්ඩායම Red bull Inter University ක්‍රිකට් තරඟාවලියේ සියළුම තරඟවලට සහභාගි වී, ජනවාරි 26 වන දින පැවති අවසන් මහා තරඟයෙන් 02 වන ස්ථානය හිමිකර ගැනීම.
- පෙබරවාරි 02 වන දින පැවත්වූ 06 වන ෂොටෝඛාන් කරාතේ ශූරතාවලිය සඳහා කරාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 07දෙනෙකු සහභාගී වීම.
- පෙබරවාරි 13 වන දින පැවත්වූ 45 වන ජාතික කැරම් ශූරතාවලිය සඳහා කැරම් ක්‍රිඩිකාවන් 06 දෙනෙකු සහභාගී වීම.
- අප විශ්වවිද්‍යාලීය බැඩ්මින්ටන් ක්‍රීඩකයින් 08 දෙනෙකු මාර්තු මස 11 සහ 12 දිනයන්හි කොළඹ විශ්වවිද්‍යාලය සංවිධානය කර පැවත්වූ ක්‍රීඩා සැණකෙළියේ ආරාධිත බැඩ්මින්ටන් තරඟාවලියට සහභාගි වීම.
- අප විශ්වවිද්‍යාල කාන්තා හා පිරිමි එල්ලේ කණ්ඩායම් මොරටුව විශ්වවිද්‍යාලය සංවිධානය කර අප්‍රේල් මස 07 දින පැවැත්වූ තුන්කොත් එල්ලේ තරඟාවලියට සහභාගි වීම.
- අප විශ්වවිද්‍යාලීය බේස්බෝල් කණ්ඩායම ජුනි මස 14 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ පැවත්වූ ජාතික බේස්බෝල් ශූරතාවය සඳහා සහභාගි වීම. එක් ක්‍රීඩකයකු ජාතික කණ්ඩායම නියෝජනය සඳහා සුදුසුකම් ලැබිය.
- ජුනි මස 29,30 සහ ජුලි 01 දිනයන්හි මොරටුව විශ්වවිද්‍යාලය සංවිධානය කර පැවැත්වූ ආරාධිත Umisf බැඩ්මින්ටන් තරඟාවලියට සහභාගි වූ අප විශ්වවිද්‍යාලීය බැඩ්මින්ටන් ක්‍රීඩකයින් 02 කු කේවල ඉසව්වෙන් ශූරතාවය සහ අනු ශූරතාවය ද යුගල ඉසව්වේ ශූරතාවය ද හිමිකර ගැනීම.
- අප විශ්වවිද්‍යාලීය හොකී ක්‍රීඩිකාවන් 05 දෙනෙකු ඒකාබද්ධ විශ්වවිද්‍යාල හොකී කණ්ඩායම නියෝජනය කරමින් ජුලි 04,05,06 සහ 07 දිනයන්හි පැවත්වූ ජාතික හොකී ශූරතාවයට සහභාගි වීම.
- අප විශ්වවිද්‍යාලීය හොකී කණ්ඩායම් 02 ක් අගෝස්තු මස 09 වන දින මොරටුව විශ්වවිද්‍යාලය සංවිධානය කර පැවැත්වූ ආරාධිත අන්තර් Mora Hockey 7 හොකී තරඟාවලියට සහභාගි වීම.
- අගෝස්තු මස 17,18 සහ19 දිනයන්හි කැළණිය විශ්වවිද්‍යාලය සංවිධානය කර මොරටුව විශ්වවිද්‍යාලයේ පැවැත්වූ ආරාධිත Faster 2013 බැඩ්මින්ටන් තරඟාවලියට සහභාගි වූ අප විශ්වවිද්‍යාලීය බැඩ්මින්ටන් ක්‍රීඩකයකු කේවල ඉසව්වෙන් අනු ශූරතාවය ද යුගල ඉසව්වෙන් ක්‍රීඩකයින් 02 කු ශූරතාවය ද හිමිකර ගනිමින් 03 වන ස්ථානය හිමිකර ගැනීම.
- අප විශ්වවිද්‍යාලීය පාපන්දු කණ්ඩායම සැප්තැම්බර් මස 03 වන දින සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සංවිධානය කර පැවැත්වූ Leaders Trophy පාපන්දු තරඟාවලියට සහභාගි වී 03 වන ස්ථානය හිමිකරගැනීම.
- අප විශ්වවිද්‍යාලීය පාපන්දු කණ්ඩායම් 02 ක් ඔක්තොම්බර් මස 03 වන දින මොරටුව විශ්වවිද්‍යාලය සංවිධානය කර පැවැත්වූ Mora Soccer Sevens 2013 පාපන්දු තරඟාවලියට සහභාගි වීම.
- අප විශ්වවිද්‍යාලීය රගර් කණ්ඩායම් 02 ක් ඔක්තොම්බර් මස 13 වන දින සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සංවිධානය කර පැවැත්වූ Leaders Trophy රගර් තරඟාවලියට සහභාගි වී 01 වන ස්ථානය හිමිකර ගැනීම.
- අප විශ්වවිද්‍යාලීය ක්‍රිකට් කණ්ඩායම ඔක්තොම්බර් මස 18,20,24,25 සහ 26 දිනයන්හි සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සංවිධානය කර පැවැත්වූ Leaders Trophy ක්‍රිකට් තරඟාවලියට සහභාගි වී 01 වන ස්ථානය හිමිකර ගැනීම.

- අප විශ්වවිද්‍යාලීය කාන්තා පිරිමි වෙස් කණ්ඩායම් දෙක ශ්‍රී ලංකා වෙස් සංගමය සංවිධානය කර ඔක්තොම්බර් මස 18,19 සහ 20 දිනයන්හි රාජකීය විද්‍යාලයේ පැවත්වූ අන්තර් සමාජ වෙස් ශූරතාවයට සහභාගි වීම.
- අප විශ්වවිද්‍යාලීය හොකී ක්‍රීඩකයින් 05 දෙනෙකු ඒකාබද්ධ විශ්වවිද්‍යාල හොකී කණ්ඩායම නියෝජනය කරමින් ඔක්තොම්බර් මස 21,22 සහ 23 දිනයන්හි පැවත්වූ ජාතික හොකී ශූරතාවයට සහභාගි වීම.
- අප විශ්වවිද්‍යාලීය ක්‍රිකට් කණ්ඩායම නොවැම්බර් මස 22 සහ 23 දිනයන්හි මොරටුව විශ්වවිද්‍යාලය සංවිධානය කර පැවැත්වූ Mora Sixes ක්‍රිකට් තරඟාවලියට සහභාගි වී 04 වන ස්ථානය හිමිකර ගැනීම.

## 03 2013 වසර සඳහා ජාත්‍යන්තර සහ ජාතික වශයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ තරඟ නියෝජනය

- 2013 වර්ෂයේ ජාත්‍යන්තර තරඟ සඳහා වැඩ බලන ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂක ටී. එස්. ඒ. අමරසේන මහතා කණ්ඩායම් භාරකරු වශයෙන් ද නිශාන්ති විදානගේ මිය මේස පන්දු පුහුණු කාරිනිය වශයෙන් ද කටයුතු කරමින් අප විශ්වවිද්‍යාලය නියෝජනය කිරීම.
- අප විශ්වවිද්‍යාලීය බැඩ්මින්ටන් ක්‍රීඩක කසුන් ලොකුගමගේ රුසියාවේ කසාන්හි ජූලි මස 06 දින සිට 17 දින දක්වා පැවති 27 වන ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය නියෝජනය කිරීම.
- අප විශ්වවිද්‍යාලීය මේසපන්දු ක්‍රීඩකයන් වන සුකිත වික්‍රමනායක හා චමීර ගමගේ මේසපන්දු ක්‍රීඩිකා මධුෂාණි පෙරේරා රුසියාවේ කසාන්හි ජූලි මස 06 දින සිට 17 දින දක්වා පැවති 27 වන ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය නියෝජනය කිරීම.
- අප විශ්වවිද්‍යාලීය ටෙනිස් ක්‍රීඩක ඉන්දික වෙත්තසිංහ රුසියාවේ කසාන්හි ජූලි මස 06 දින සිට 17 දින දක්වා පැවති 27 වන ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය නියෝජනය කිරීම.
- අප විශ්වවිද්‍යාලීය පිහිණුම් ක්‍රීඩකයන් වන කෞෂාල් ප්‍රදීප් මානවඩු, රෙහාන් නිලංක ජයසේකර, අෂේන් හරිත් ප්‍රනාන්දු සහ පුන්හස සසිරි සේනානායක රුසියාවේ කසාන්හි ජූලි මස 06 දින සිට 17 දින දක්වා පැවති 27 වන ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය නියෝජනය කිරීම.
- අප විශ්වවිද්‍යාලීය මලල ක්‍රීඩකයන් වන එච්.එල්. ලහිරු දිලංකර, පි.ඩබ්. ගයාන් සංජීව සහ ජී.ඒ. දිනේෂ් මධුසංක රුසියාවේ කසාන්හි ජූලි මස 06 දින සිට 17 දින දක්වා පැවති 27 වන ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය නියෝජනය කිරීම.
- අප විශ්වවිද්‍යාලීය මලල ක්‍රීඩිකාවන් වන ජී.ඒ. ඉෂාරා සංදීපනි දයානන්ද , එස්.ටී. දනේෂා දයාරත්න සහ දෙව්නි කලනිකා මධුරප්පෙරුම රුසියාවේ කසාන්හි ජූලි මස 06 දින සිට 17 දින දක්වා පැවති 27 වන ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය නියෝජනය කිරීම.

## 04 2013 ශ්‍රී විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලිය

2013 මැයි මස 02 දින සිට 12 දින දක්වා මොරටුව විශ්වවිද්‍යාලය සංවිධානය කර පැවත්වූ ශ්‍රී විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලියට අප විශ්වවිද්‍යාලයේ කාන්තා/පිරිමි වශයෙන් ක්‍රීඩා කණ්ඩායම් 31 ක් ක්‍රීඩා තරඟ සඳහා ඉදිරිපත් විය.

- අප විශ්වවිද්‍යාලීය පිරිමි බැඩ්මින්ටන් කණ්ඩායම ශූරතාවය හිමිකරගත් අතර කාන්තා බැඩ්මින්ටන් කණ්ඩායම අර්ධ අවසන් පූර්ව තරඟය දක්වා තරඟවලට සහභාගි විය.

- අප විශ්වවිද්‍යාලීය කාන්තා පැසිපන්දු කණ්ඩායම ශූරතාවය හිමිකරගත් අතර පිරිමි පැසිපන්දු කණ්ඩායම 03 වන ස්ථානය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය පිරිමි වෙස් කණ්ඩායම 03 වන ස්ථානයද කාන්තා වෙස් කණ්ඩායම අනු ශූරතාවය ද හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය කාන්තා එල්ලේ කණ්ඩායම අනු ශූරතාවය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය පිරිමි හොකී කණ්ඩායම 03 වන ස්ථානය හිමිකරගත් අතර කාන්තා හොකී කණ්ඩායම 04 වන ස්ථානය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය දැල්පන්දු කණ්ඩායම 04 වන ස්ථානය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය පිරිමි කරාතේ කණ්ඩායම 03 වන ස්ථානය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය මාර්ග ධාවන කණ්ඩායම අනු ශූරතාවය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය පිරිමි පිහිණුම් කණ්ඩායම ශූරතාවය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය පිරිමි තයිකොන්ඩෝ කණ්ඩායම 03 වන ස්ථානය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය කාන්තා පිරිමි මේසපන්දු  කණ්ඩායම් 02 ම ශූරතාවය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය පිරිමි ටෙනිස් කණ්ඩායම 04 වන ස්ථානය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය කාන්තා පිරිමි මලල  ක්‍රීඩා කණ්ඩායම් 02 ම ශූරතාවය හිමිකරගන්නා ලදී.
- අප විශ්වවිද්‍යාලීය පිරිමි අත්පන්දු කණ්ඩායම 03 වන ස්ථානය හිමිකරගත් අතර කාන්තා අත්පන්දු කණ්ඩායම අනු ශූරතාවය හිමිකරගන්නා ලදී.

## 05 ඉදිරියේදි සහභාගිවීමට නියමිත තරඟ - 2013

- ජාතික තරුණ සේවා සභා රූපවාහිනී සුපර් ලීග් අත්පන්දු ශූරතාවය

## 06 2012 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 39  වන වර්ණ ප්‍රදාන උළෙල

2013 පෙබරවාරි මස ශාරීරික අධ්‍යාපන අංශය සංවිධානය කර පවත්වන ලදී.

## 07 පුහුණු තරඟ

ක්‍රිකට්, බේස්බෝල්, හොකී සහ අත්පන්දු ක්‍රීඩා සඳහා පුහුණු තරඟවලට සහභාගි විය.

## 08 පුහුණු වැඩසටහන්

- පෙබරවාරි 16 සහ 17 දිනයන්හි පිළියන්දල ෂොමැන්ග් විෂන් ආයතනයේ පැවත්වූ තයිකොන්ඩෝ පුහුණු කඳවුරට අප විශ්වවිද්‍යාලීය තයිකොන්ඩෝ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 10 දෙනෙකු  සහභාගී වීම.
- මාර්තු 15,16,17 සහ 18 දිනයන්හි බෙලිහුල්ඔය ඇකඩමි ඔෆ් ඇඩ්වෙන්චර් ආයතනයේ පැවත්වූ නායකත්ව පුහුණු කඳවුරට අප විශ්වවිද්‍යාලීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් 70 දෙනෙකු සහභාගී වීම.
- නෙදර්ලන්ත කරාතේ පුහුණුකරු තීමොරි පීටර්සන් මහතා ජුනි මස 15 දින ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පැවත්වූ කරාතේ පුහුණු වැඩසටහනට සහභාගී වීම.
- නෙදර්ලන්ත කරාතේ පුහුණුකරු තීමොරි පීටර්සන් මහතා ජුනි මස 15 දින ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පැවත්වූ කරාතේ පුහුණු වැඩසටහනට අප විශ්වවිද්‍යාලීය කරතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 07දෙනෙකු  සහභාගී වීම.

# කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

2013 වර්ෂය සඳහා කර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ආචාර්ය ආර්.බී. මාරසිංහ මහතා කාර්යමණ්ඩල අධ්‍යක්ෂ වශයෙන් තවදුරටත් අර්ධකාලීන වශයෙන් කරයුතු කරන ලදී.

අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පවත්වන ලද වැඩමුළු දේශන හා සහතික පත්‍ර පාඨමාල

| **දිනය** | දේශන තේමාව | කවුරුන් සඳහාද | පවත්වන ලද්දේ |
|---|---|---|---|
| 08.04.2013 | හඳුන්වාදීමේ වැඩ සටහන් | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | ආචාර්ය එන්. එල්.ඒ. කරුණාරත්න උපකුලපති ශ්‍රී.ජ.වි.වි |
| 03.05.2013 | "තාත්වික උපාධිධරයෙකුගේ තත්වය එවැනි උපාධිධරයන් බිහි කිරීම සඳහා අවශ්‍ය ගුණාංග" | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | ආචාර්ය ආර්.බී මාරසිංහ අධ්‍යක්ෂ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය<br>මහාචාර්ය බී.ඒ.තන්ත්‍රිගොඩ භෞතික විද්‍යා අධ්‍යනාංශය ව්‍යවහාරික විද්‍යා පීඨය |
| 17.05.2013 | ක්‍රියාශීලී ඉගෙණීම ඉනැගන්වීම සහ තක්සේරු කිරීම | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | අචාර්ය පී.ඩයස් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංඛ්‍යාණය හා පරිගණක විද්‍යා අධ්‍යනාංශය ව්‍යාවහාරික විද්‍යා පීඨය |
| 31.05.2013 | පවත්නා ක්‍රමය හඳුන්වාදීම අභියෝග සහ විශ්වවිද්‍යාල පද්ධතියේ ඉදිරි සංවර්ධනය | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | ආචාර්ය පී.රත්නවීර හිටපු අධක්ෂ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය |
| 07.06.2013 | විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකුට පර්යේෂන දියුණු කිරීම සඳහා අවශ්‍ය නිපුනතාවය | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | එම්.වී.එස්.එස් උදයංග මහතා අධ්‍යනාංශ ප්‍රධාන ව්‍යවසායකත්ව අධ්‍යනාංශය කළමානාකරණ අධ්‍යයයන හා වාණිජ විද්‍යා අධ්‍යයන පීඨය |
| 23.03.2012 | සාර්ථක ඉගැන්වීම සඳහා නවීන තාක්ෂණ භාවිතය | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | |
| 21.06.2013 | අන්‍යොන්‍ය වෘත්තිය නිපුනතා දියණු කිරීම | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | මහාචාර්ය එස් සිවයෝගන් මහතා පවුල් සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය වෛද්‍ය විද්‍යා පීඨය |
| 05.07.2013 | විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ ජීවන තත්වය ඉහළ දැමීම | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | |
| 19.07.2013 | ක්ෂුද්‍ර තාක්ෂණය ඉගැන්වීමේ හා පුහුණුවීමේ සැසිය | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | වෛද්‍ය ගෝමින්ද පොන්නම්පෙරුම ජ්‍යෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය විද්‍යා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය |
| 02.08.2013 | ක්ෂුද්‍ර තාක්ෂණය ඉගැන්වීමේ හා පුහුණුවීමේ සැසිය | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | |
| 16.08.2013 | ක්ෂුද්‍ර තාක්ෂණය ඉගැන්වීමේ හා පුහුණුවීමේ සැසිය | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | |
| 30.08.2013 | ක්ෂුද්‍ර තාක්ෂණය ඉගැන්වීමේ හා පුහුණුවීමේ සැසිය | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | |
| 27.09.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු කිරීමේ වැඩ සටහන් | ආධුනික කථිකාචාර්ය හා ජෙයෂ්ඨ කථිකාචාර්ය | |
| 28.09.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු කිරීමේ වැඩ | ආධුනික කථිකාචාර්ය හා | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය |

| | | | |
|---|---|---|---|
| | සටහන් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 29.09.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු කිරීමේ වැඩ සටහන් | ආධුනික කථිකාචාර්ය හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | |
| 04.10.2013 | ඇගයීමේ ක්‍රමවේදය | ආධුනික කථිකාචාර්ය හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | වෛද්‍ය මාරසිංහ මහතා අධ්‍යක්ෂ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, |
| 01.11.2013 | ශිෂ්‍ය ප්‍රජාවේ විෂයමාලාවෙන් පිටස්තර කටයුතු සඳහා අධ්‍යයන ප්‍රජාවේ සහභාගීත්වය දියුණු කිරීම | ආධුනික කථිකාචාර්ය හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | පී.ඩයස් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංඛ්‍යානය හා පරිගණක විද්‍යා අධ්‍යයනාංශය ව්‍යවහාරික විද්‍යා පීඨය |
| 06.12.2013 | නිලතල තක්සේරු කිරීම | ආධුනික කථිකාචාර්ය හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | වෛද්‍ය ගෝමින්ද පොන්නම්පෙරුම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය විද්‍යා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය |
| 20.12.2013 | පරීක්ෂා කළමනාකරණ සඳහා විවෘත මෘදුකාංග | ආධුනික කථිකාචාර්ය හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | රනිල් පීරිස් මහතා, ජ්‍යෙෂ්ඨ කථිකචාර්ය තොරතුරු හා තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය කළමනාකරණ අධ්‍යයනා හා වාණිජ විද්‍යා පීඨය |

විධායක නිලධාරීන් සඳහා පවත්වන වැඩමුලු

| **දිනය** | **දේශන තේමාව** | **කවුරුන් සඳහාද** | **සම්පත් දායකත්වය** |
|---|---|---|---|
| 23.07.2013 | ශාරීරික යෝග්‍යතා වැඩ සටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විධායක නිලධාරීන් | රමණී කුලතිලක මහත්මිය ශාරීරික අධ්‍යාපන උපදේශක |
| | මුදල් රෙගුලාසි හා විගණනය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විධායක නිලධාරීන් | ජේ.ඒ. විමලදාස මහතා රාජ්‍ය මූල්‍ය මුදල් හා ක්‍රම සම්පාදන අධ්‍යනාංශය |
| | වෙනස් කළමානාකරණය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විධායක නිලධාරීන් | එම්.වී.එස්.එස් උදයංග මහතා අධ්‍යනාංශ ප්‍රධාන ව්‍යවසායකත්ව අධ්‍යනාංශය කළමානාකරණ අධ්‍යයයන හා වාණිජ විද්‍යා අධ්‍යයන පීඨය |
| 25.10.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විධායක නිලධාරීන් | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 26.10.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විධායක නිලධාරීන් | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 27.10.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විධායක නිලධාරීන් | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |

අධ්‍යයන කාර්යමණ්ඩ සඳහා පවත්වන වැඩමුලු

| **දිනය** | **දේශන තේමාව** | **කවුරුන් සඳහාද** | **සම්පත් දායකත්වය** |
|---|---|---|---|
| 11.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 12.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |

| | | | |
|---|---|---|---|
| 13.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 14.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 15.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | වෛද්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 16.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | වෛද්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලය | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |

අනධ්‍යයන කාර්යමණ්ඩල සඳහා පවත්වන ලද වැඩසටහන්

| **දිනය** | **දේශන තේමාව** | **කවුරුන් සඳහාද** | **සම්පත් දායකත්වය** |
|---|---|---|---|
| 21.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | පරිපාලන ගොඩනැගිල්ලේ අනධ්‍යයන කාර්යමණ්ඩලය | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 22.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | පරිපාලන ගොඩනැගිල්ලේ අනධ්‍යයන කාර්යමණ්ඩලය | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 23.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | පරිපාලන ගොඩනැගිල්ලේ අනධ්‍යයන කාර්යමණ්ඩලය | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 23.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | පරිපාලන ගොඩනැගිල්ලේ අනධ්‍යයන කාර්යමණ්ඩලය ,විනයාරක්ෂක කාර්යාලය නඩත්තු හා ශිෂ්‍ය සුභ සාධන | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 24.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | පරිපාලන ගොඩනැගිල්ලේ අනධ්‍යයන කාර්යමණ්ඩල ආරක්ෂක අංශය, විනයාරක්ෂ කාර්යාලය නඩත්තු හා ශිෂ්‍ය සුභ සාධක | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |
| 25.11.2013 | වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන | පරිපාලන ගොඩනැගිල්ලේ අනධ්‍යයන කාර්යමණ්ඩල ආරක්ෂක අංශය, විනයාරක්ෂක කාර්යාලය නඩත්තු හා ශිෂ්‍ය සුභ සාධක අංශය | ත්‍රාසජනක අත්දැකීම පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ ඇකඩමිය (පුද්ගලික) බෙලිහුල්ඔය. |

# බාහිර විභාග අංශය

1979 වර්ෂයේ වාණිජ විද්‍යා බාහිර උපාධි පාඨමාලාව ආරම්භ කිරීමත් සමග ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර විභාග අංශය ක්‍රියාත්මක විය. ඊට පසුව සාමාන්‍ය ශාස්ත්‍රවේදි උපාධි වැඩසටහන ආරම්භ විය. විද්‍යාවේදි රාජ්‍ය පරිපාලන හා ව්‍යාපාර පරිපාලන බාහිර උපාධි වැඩ සටහන් 1997 සිට ක්‍රියාත්මක විය. සාමාන්‍ය ශාස්ත්‍රවේදි හා විද්‍යාවේදි ව්‍යාපාර පරිපාලන විද්‍යා බාහිර උපාධි පාඨමාලා බොහෝසේ ජනප්‍රිය භාවයට පත්විය.

ඉදිරිපත් කෙරෙන පාඨමාලා පිළිබඳ කෙටි විස්තරය

- සාමාන්‍ය ශාස්ත්‍රවේදි උපාධිය
- විද්‍යාවේදි ව්‍යාපාර පරිපාලනය
- විද්‍යාවේදි රාජ්‍ය පරිපාලනය
- වාණිජවේදි(සාමාන්‍ය)

**2013 වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව**

සාමාන්‍ය ශාස්ත්‍රවේදි උපාධි
විද්‍යාවේදි ව්‍යාපාර පරිපාලන
විද්‍යාවේදි රාජ්‍ය පරිපාලන
වාණිජවේදි (සාමාන්‍ය)

මෙම වසර තුල ලියා පදිංචිය සිදු කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාද කොමිෂන් සභාවේ අනුමැතිය ලබාදී නැත

2001 වසරේ සිට බාහිර විභාග උපාධි ධාරීන් සඳහා උපාධි ප්‍රදානෝත්සවය ආරම්භ කල අතර 2013 වසරේ දී 10 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය පවත්වන ලදී. එහිදී උපාධි ලබාගත් උපාධි ධාරීන් සංඛාව පහත පරිදි වේ.

බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව

| උපාධිය | උපාධිදාරීන් සංඛ්‍යාව |
|---|---|
| සාමාන්‍ය ශාස්ත්‍ර වේදී උපාධි | 1420 |
| විද්‍යා වේදී ව්‍යාපාර පරිපාලන | 1758 |
| විද්‍යාවේදී රාජ්‍ය පරිපාලනය | 66 |
| වාණිජවේදී (සාමාන්‍ය) | 80 |
| | 3324 |

# පුස්තකාලය

පුස්තකාලයාධිකාරී ආචාර්ය නයනා විජේසුන්දර මහත්මියගේ අධීක්ෂණය යටතේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකායාධිපතින් පස් දෙනකු එක් සහකාර පුස්තකාලයාධිකාරීවරයෙකු සහ එක් සහකාර ලේඛකාධිකාරී පුස්තකාල සේවා සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයන් 49 දෙනකු 2013.10.01 දින සිට පුස්තකාලයයේ රාජකාරී ඉටු කරනලදී.

අදාල වර්ෂයේ මුදල් වෙන් කිරීම යටතේ රුපියල් 4,586,277.37 වටිනා පොත් පත් රුපියල් 8,191,661.08. වටිනා වාරික සඟරා සහ රුපියල් 132,000.00 වටිනා දත්ත පද්ධතියක් ද මිලදී ගන්නා ලදී.

අදාල වර්ෂයේ පාඨකයන් 3810ක් ලියාපදිංචි කරන ලදී. මේ සංඛ්‍යාව අධ්‍යයන කාර්ය මණ්ඩල (39) අනධ්‍යයන කාර්යමණ්ඩල (52) උපාධි අපේක්ෂකයන් (3145) ඩිප්ලෝමා සහ පශ්චාද් උපාධි අපේක්ෂකයන් (574) සමන්විත විය. මේ අනුව පුස්තකාලය පරිහරණය කරන සංඛ්‍යාව 15,467 දක්වා ඉහල නැගිනි.

අන්තර් පුස්තකාලය හුවමාරු ඉල්ලීම් ප්‍රතිශතය 81.69% දක්වා සම්පූර්ණ විය.තොරතුරු සම්පත් හා තොරතුරු එක්රැස් කිරීමේ නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා සිසුන්ට වැඩ මුලු තුනක් පවත්වන ලදී.

වර්ෂය කළ පුස්තකාල කාර්ය මණ්ඩල හවතුන් එක් ආචාර්ය උපාධියක් සහ එක් ශාස්ත්‍රපති උපාධියක් සම්පූර්ණ කරන ලදී. තවද ආචාර්ය උපාධි 02ක් සඳහා පශ්චාද් ඩිප්ලෝමා 01ක් සඳහා ද උපාධි 02 ක් සඳහා ද ඩිප්ලෝමා 07ක් සඳහාද 2013 වර්ෂය තුළ පුස්තකාල කාර්ය මණ්ඩල සේවකයන් අධ්‍යයන කටයුතු වල නිරතවී සිටියහ.

ස්වයංක්‍රීය බෙදාහැරීමේ පද්ධතිව ප්‍රථම වර්ෂ සිසුන් සඳහා ක්‍රියාත්මක විය.

වර්ෂයතුල ආදායම් උපදවීම.

| | | | |
|---|---|---|---|
| (අ) | පුස්තකාල ප්‍රවේශ පත්‍ර අනුපිටපත් | :රු. | 2,140.00 |
| (ආ) | නැති කරන ලද පොත් ආපසු මිලදී ගැනීම් වටිනාකම | :රු. | 156,259.96 |
| (ඇ) | පැහැදිලි කිරීමේ සහතික නැවත නිකුත් කිරීම (පැහැදිලි කිරීමේ සහතික නැති කරන ලද අය) | :රු. | 1,230.00 |
| (ඈ) | පුස්තකාල දඩ | :රු. | 355,236.50 |
| (ඉ) | පුස්තකාල අයවීම පරීක්ෂා කොට පුස්තකාල ප්‍රවේශ පත්‍ර නැවත නිකුත් කිරීම | :රු. | 4,320.00 |
| (උ) | ජායස්ති පිටපත් නිකුත් කිරීම සඳහා | :රු. | 5442.50 |
| | **එකතුව** | **:රු.** | **524,628.96** |

# අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශයේ ව්‍යුහය හා කාර්යභාරය

නියෝජ්‍ය අභ්‍යන්තර විගණකගේ මූලිකත්වයෙන් අභ්‍යන්තර විගණන අංශය පාලනවේ. වර්ෂය සඳහා වූ විගණන වැඩ සටහන පිළියෙල කොට විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ. එහි පිටපතක් විගණකාධිපති වරයාගේ අනුමැතිය සඳහාත් ඉදිරිපත් කෙරේ.

විගණන හා කළමනාකරන කමිටු රැස්වීම්

විගණන හා කළමනාකරන කමිටුවේ පාලක සභා සාමාජිකයකු හැටියට විධායක නොවන තත්වයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලද අතර තවත් පාලක සභා සමාජිකයන් තිදෙනෙක් ද විධායක නොවන තත්වයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී. 2013 වර්ෂයේ කමිටුව සිව් වරක් රැස්වී පහත සඳහන් වැදගත් කරුණු සාකාච්ඡා කරන ලදී.

අ) පවත්නා තත්වය විමර්ශනයට භාජනය කරන ලද අතර ඉන් බැහැරව ක්‍රියා කොට තිබෙන තත්වය වැඩි දියුණුව සඳහා පාලක සභාවේ අනුමැතිය සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී.

ආ) විගණකාධිපතිවරයාගේ විමසීම් වලට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ පිළිතුරු කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමඟ මේ ගැන සාකච්ඡා කොට නිවැරදි ක්‍රියා අනුගමනය කරමින් මෙවැනි වැරදි සිදු නොවන අන්දමට ක්‍රියා කිරීමට තීරණය කරන ලදී.

පූරව විගණන

නිවැරදි භාවය තහවුරු කිරීම සඳහා ගෙවීම් කිරීමට පෙර පහත සඳහන් පූර්ව විගණන සිදු කරන ලදී.

- අර්ථ සාධක අරමුදල් මුදා හැරීම
- පාරිතෝෂික මුදල් ගෙවීම
- විශ්‍රාම වැටුප් නිදහස් කිරීම සඳහා ඉල්ලීම
- ඉදිකිරීම් සඳහා ගෙවීම
- බැඳුම්කර වටිනාකම් ගණනය කිරීමේ නරවද්‍යතාවය
- කොන්ත්‍රාත් ගිවිසුම් මුදා හැරීම

අභන්තර විගණන වාර්තා

විගණකාධිපතිවරයාට සහ විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන විගණන නිලධාරියාට පිටපත් සහිතව පහත සඳහන් විගණන වාර්තා උපකුලපති වරයාට ඉදිරිපත් කරන ලදී.

- විදේශ නිවාඩු බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීම
  මෝටර් රථ අළුත්වැඩියා සහ නඩත්තු පිළිබඳ වාර්තා
  ප්‍රධාන ගබඩාවේ භෞතික පරීක්ෂාව ( කලින් නොදැන්වූ)
  නඩත්තු ගබඩාවේ භෞතික පරීක්ෂාව(කලින් නොදැන්වූ)
- PIM පිළිබඳ විගණන වාර්තාව
- මෙතෙක් නොගෙවන ලද විදුලි හා ජල බිල්පත්

# මූලධන වැඩ හා ගොඩනැගිලි වැඩිදියුණුදිකිරීම්

| අංකය. | ව්‍යාපෘති නම | ආරම්භක දිනය | සම්පූර්ණ කළ දිනය | අගය රුපියල් | වෙනත් |
|---|---|---|---|---|---|
| 1. | පුස්තකාල ගොඩනැගිල්ල ආසන්නයේ ඉදිකරන ලද අතිපූජ්‍ය සෝරත හිමිපානන්ගේ පිළිරුව ස්ථාපිත කිරීමේ පාදම සකස් කිරීම | 11.06.2013 | 15.07.2013 | 831,714.00 | සම්පූර්ණ කර ඇත. |
| 2. | පරිපාලන ගොඩනැගිල්ලේ අනධ්‍යයන ,අධ්‍යයන, මූලධන අංශ නවීකරනය කිරීම | 08.07.2013 | 24.02.2014 | 4,744,858.00 | සම්පූර්ණ කර ඇත. |
| 3. | පරිපාලන ගොඩනැගිල්ලේ පින්තාරු හා නවීකරණය කිරීම | - | - | 10,222,712.50 | ටෙන්ඩර් කැඳවීම මට්ටමේ |
| 4. | ගණකාධිකරණ අධ්‍යනාංශයේ සම්පත් මධ්‍යස්ථානයේ නවීකරනය | 08.07.2013 | 21.08.2013 | 232,000.00 | සම්පූර්ණ කර ඇත. |
| 5. | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පැළ ගෘහයේ නවීකරනය | 14.10.2013 | - | 1,750,000.00 | සිදු කෙරෙමින් පවතී |
| 6. | ව්‍යවහාරික විද්‍යා පීඨයේ වන ගෘහය නවීකරණය | 14.10.2013 | 05.12.2013 | 1,536,500.00 | සම්පූර්ණ කර ඇත. |
| 7. | නඩත්තු අංශයේ කොටස් වෙන් කිරීම | 18.11.2013 | Feb.2014 | 915,000.00 | සම්පූර්ණ කර ඇත. |
| 8. | පුස්තකාල ගොඩනැගිල්ල ආසන්නයේ ඉදිකරන ලද අතිපූජ්‍ය සෝරත හිමිපානන්ගේ පිළිරුව ස්ථාපිත කිරීම ග්‍රැනයිට් ගල් ඇල්ලීම | 17.06.2013 | 15.07.2013 | 625,000.00 | සම්පූර්ණ කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9. | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයේ තුන් වන පියවර - ආරක්ෂක බැම්ම ඉදිකිරීම | 01.01.2014 | - | 7,801,349.67 | සිදු කෙරෙමින් පවතී |
| 10. | වෛද්‍ය විද්‍යා පීඨයේ පැරා වෛද්‍ය විද්‍යා ගොඩනැගිල්ලේ ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යානාංශ රසායනාගාරය නවීකාරණය කිරීම | - | - | මිලියන 3.8 | ලංසු කැඳවා තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත යොමුකර ඇත |
| 11 | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පාලි හා බෞද්ධ අධ්‍යනාංශ යේ නවීකරණ කටයුතු | - | - | මිලියන 8.08 | ලංසු කැඳවා තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත යොමුකර ඇත |
| 12 | ව්‍යවහාරික විද්‍යා පීඨයේ උද්භිද විද්‍යා අධ්‍යනාංශ කොටසේ නවිකරණ කටයුතු | - | - | 2,754,690.00 | ලංසු කැඳවා තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත යොමුකර ඇත |
| 13 | ශිෂ්‍ය සුභ සාධක අංශයේ නවීකරණ කටයුතු | - | - | 3,161,215.00 | ටෙන්ඩර් කැඳවා ඇත |
| 14 | වෛද්‍ය මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු | - | - | 1,712,960.00 | ටෙන්ඩර් කැඳවා ඇත |

## වර්ෂය සඳහා අධ්‍යයන පරිපලන අධ්‍යයන සහය සහ අධ්‍යයන නොවන කාර්යමණ්ඩල තොරතුරු

### අධ්‍යයන පරිපලන හා අධ්‍යයන සහාය කාර්ය මණ්ඩල විස්තර

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය තනතුරු (2012) | පුරප්පාඩු /අතිරික්තය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | 4 | 7 | 3 |
| මහාචාර්ය | 42 | 49 | 07 |
| සහාය මහාචාර්ය | 15 | 08 | 07 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 | 240 | 302 | 62 |
| කථිකාචාර්ය | 9 | 41 | 32 |
| කථිකාචාර්ය (ආධුනික) | 248 | 78 | 170 |
| උප එකතුව | **558** | **485** | **281** |
| ලේඛකාධිකාරි | 1 | 1 | 0 |
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | 4 | 1 | 02 |
| කොන්ත්‍රාත් පදනම (ව්‍යවහාරික විද්‍යා) | | 01 | |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 5 | 7 | 2 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (පුස්තකාල සේවා) | 1 | 1 | 0 |
| සහකාර ලේඛකාධිකාරි | 08 | 4 | 03 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි- නෛතික හා ප්‍රලේඛන | 1 | 1 | 0 |
| මූල්‍යාධිකාරි | 1 | 1 | 0 |

| | | | |
|---|---|---|---|
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි | 1 | 1 | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | 2 | 7 | 1 |
| සහකාර මූල්‍යාධිකාරි | 6 | 3 | 1 |
| නියෝජ්‍ය අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| ව්‍යාපෘති කළමනාකරු | 1 | 1 | 0 |
| වැඩ ඉංජිනේරු | 1 | 1 | 0 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරි | 1 | 1 | 0 |
| පුස්තකාලයාධිකාරි | 1 | 1 | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි | 3 | 5 | - |
| සහකාර පුස්තකාලයාධිකාරි | 6 | 1 | 2 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරි | 1 | 1 | 0 |
| වෛද්‍ය නිලධාරි | 2 | 2 | 0 |
| ජ්‍යෙෂ්ඨ දන්ත වෛද්‍ය | 1 | 0 | 1 |
| උප එකතුව | **48** | **43** | **12** |
| උපදේශක (පරි. තාක්‍ෂණ) | 20 | 03 | 16 |
| ඉංග්‍රිසි උපදේශක | 0 | 4 | 4 |
| පරිගණක වැඩ සටහන් සම්පාදක | 8 | 2 | 5 |
| වැඩසටහන් සම්පාදක /පද්ධති විශ්ලේෂක | 1 | 1 | - |
| ශාරීරික අධ්‍යාපන උපදේශක | 5 | 5 | 0 |
| වෘත්තීය උපදේශක | 1 | 2 | 1 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්ය මණ්ඩල | 1 | 0 | 0 |
| ප්‍රධාන කාර්මික නිලධාරි | 1 | 1 | 0 |
| උපදේශක සමාජ සේවා | 1 | 1 | 0 |

| | | | |
|---|---|---|---|
| විද්‍යාත්මක සහකාර | 0 | 1 | 1 |
| කෞතුකාගාර පාලක | 1 | 1 | 0 |
| මාණ්ඩලික කාර්මික නිලධාරි | 1 | 1 | |
| උප එකතුව | **40** | **22** | **27** |
| **එකතුව** | **646** | **597** | **332** |

## අනධ්‍යයන කාර්යමණ්ඩල විස්තර

| **තනතුර** | | **අනුමත තනතුරු (2008/2012/2013)** | **පවතින තනතුරු** | **වසරතුල නව බඳවාගැනීම්** |
|---|---|---|---|---|
| 1 | සෞඛ්‍ය උපස්ථායිකා | 1 | 1 | 0 |
| 2 | ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික නිලධාරී | 2 | 0 | 0 |
| 3 | පොත් බඳින්නා | 2 | 1 | 0 |
| 4 | පොත් තබන්නා | 5 | 5 | 0 |
| 5 | නේවාසිකාගාර භාරකරු | 12 | 2 | 0 |
| 6 | වඩු කාර්මික | 5 | 5 | 0 |
| 7 | ලිපිකරු | 118 | 117* | 11 |
| 8 | පරිගණක යෙදුම් සහකාර | 80 | 78 | 06 |
| 9 | බයිසිකල් පනිවිඩකරු | 1 | 1 | 0 |
| 10 | දත්ත ක්‍රියාකරු | 1 | 0 | 0 |
| 11 | දන්ත හෙදි | 1 | 1 | 0 |
| 12 | නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 1 | 0 | 0 |
| 13 | සැලසුම් ශිල්පි | 1 | 0 | 0 |
| 14 | රියදුරු | 27 | 27 | 2 |
| 15 | විදුලිකාර්මික | 5 | 4 | 1 |
| 16 | උද්‍යාන පාලක | 1 | 1 | 0 |
| 17 | වායු උත්පාදක යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 0 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| 18 | විදුරු පිඹින්නා | 1 | 1 | 0 |
| 19 | උපාධිධාරී භාෂා පරිවර්තක | 1 | 1 | 0 |
| 20 | ක්‍රීඩාපිටි නඩත්තු සේවක | 1 | 1 | 0 |
| 21 | සෞඛ්‍ය සේවා කම්කරු | 16 | 14 | 5 |
| 22 | විද්‍යාගාර සහයක | 75 | 66 | 9 |
| 23 | කම්කරු | 184 | 196 | 31 |
| 24 | උද්‍යාන අධිකාරී | 1 | 1 | 0 |
| 25 | පුස්තකාල සහකාර | 29 | 26 | 0 |
| 26 | පුස්තකාල සේවක | 12 | 10 | 0 |
| 27 | රිය සහයක | 2 | 2 | 0 |
| 28 | තනකොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු | 2 | 0 | 0 |
| 29 | විනයාරක්ෂක | 8 | 5 | 0 |
| 30 | පෙදරේරු | 5 | 4 | 1 |
| 31 | කාර්මික ශිල්පී | 1 | 0 | 0 |
| 32 | හෙද නිලධාරී | 6 | 4 | 1 |
| 33 | කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු | 8 | 8 | 4 |
| 34 | පින්තාරුකරු | 2 | 1 | 0 |
| 35 | ඖෂධවේදී | 4 | 3 | 1 |
| 36 | පොලිෂ්කරන්නා | 2 | 2 | 0 |
| 37 | මරණ පරීක්ෂන කම්කරු | 2 | 1 | 0 |
| 38 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 2 | 1 | 0 |
| 39 | පොම්ප ක්‍රියාකරු | 2 | 1 | 0 |
| 40 | ජල නල කර්මික | 3 | 3 | 0 |
| 41 | ආරක්ෂක සේවක | 25 | 23 | 2 |
| 42 | ආරක්ෂක පරීක්ෂක | 1 | 0 | 0 |
| 43 | සරප් | 2 | 2 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| 44 | නිදර්ශක එකතු කරන්නා | 1 | 1 | 0 |
| 45 | ලඝු ලේඛක | 28 | 20 | 3 |
| 46 | ගබඩා භාරකරු | 5 | 3 | 0 |
| 47 | ගබඩාකරු | 1 | 1 | 0 |
| 48 | උප ශාලාධිපති(පූර්ණකාලින) | 9 | 9 | 0 |
| 49 | සැපයීම් නිලධාරී | 1 | 1 | 0 |
| 50 | කාර්මික නිලධාරී | 101 | 88 | 13 |
| 51 | පිළිගැනීමේ නිලධාරී/ දුරකථන ක්‍රියාකරු | 2 | 3 | 0 |
| 52 | ත්‍රී රෝද රථ රියදුරු | 2 | 1 | 0 |
| 53 | බෙලෙක්කරු | 1 | 0 | 0 |
| 54 | ට්‍රැක්ටර් ක්‍රියාකරු | 2 | 1 | 0 |
| 55 | අත් ට්‍රැක්ටර් ක්‍රියාකරු | 1 | 1 | 0 |
| 56 | යතුරු ලේඛක | 15 | 6 | 0 |
| 57 | වැඩ අධිකාරී | 3 | 1 | 0 |
| 58 | වැඩ අධීක්ෂක | 8 | 4 | 0 |
| | | **841** | **759** | **88** |

* තනතුරු 5 යටපත්කර පරිගණක යෙදුම් සහකාර තනතුරු ඇති කර ඇත.

* වැටුප් රහිත නිවාඩු ලබා ඇති සේවක පඩි වලින් ගෙවීම හා උපයාගත් අරමුදල් වලින් පඩි ගෙවීමට යටත්ව. පවතින පුරප්පාඩු සඳහා සේවා පැවරුම් පදනම ලිපිකරු තනතුරු 7 ක් බඳවාගැනීම

* උපයාගත් අරමුදලින් ගෙවීමට යටත්ව කමකරු තනතුරු 11 ක් ඇති කිරීම

# ඉදිරි සැලැස්ම

## සංයුක්ත සැලැස්ම (2014-2018)

ඉලක්ක

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලට ප්‍රවේශ වීමේ අවස්ථා වැඩි කිරීම.
2. විශ්වවිද්‍යාලය ලෝක තත්වයට උසස් කිරිම
3. උපාධිධාරීන්ගේ තත්වය හා රැකියා ලාභිත්වය වැඩි කිරීම
4. පරික්ෂකවරුන්ගේ තෘප්තිය වැඩි දියුණු කිරීම
5. ගෝලීය අනුකූලතාවය ගෝලීය සම්බන්ධතා සහ ගොලීය හුවමාරු වැඩි දියුණු කිරීම
6. පර්යේෂණ ප්‍රකාශන විශිෂ්ටත්වය හා වාණිජකරණය
7. ආයෝජන හා විදේශ විනිමය ආකර්ෂනය කිරීම
8. අතිවෂිශ්ය තරඟකාරිත්වය ලබා ගැනීමේ නිදහස
9. උපාධිධාරී ව්‍යවසායකත්වය දියුණු කිරීම
10. පද්ධතියේ කාර්යක්ෂමතාව ප්‍රබල ලෙස දියුණු කිරීම
11. ජාතික සංවර්ධනය සංහිදියාව සහ සාමය වැඩි දියුණු කිරීම
12. විශ්විද්‍යාලයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

**කාර්යමණ්ඩල සංවර්ධනය**

කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සැලසුම් කර ඇත.

- උසස් අධ්‍යාපන ආයතන වල ඉගැන්වීමේ සහතික පත්‍ර වැඩසටහන් (CTHE)
- සියලුම වර්ගයේ අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා වැඩ සටහන් හඳුන්වා දීම
- සියලුම අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා වැඩමුළු
- සියලුම අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා වැඩමුළු
- අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා කෙටිකාලීන පරිගනක පාඨමාලා
- අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා කෙටිකාලීන ඉංග්‍රීසි පාඨමාලා

# වාර්ෂික ගිණුම් වාර්තා

# 2013

## පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | රු. 2012 Rs | රු 2013 |
|---|---|---|
| සේවක වැටුප් හා දීමනා | 1,089,575,284.00 | 1,332,797,583.00 |
| ගමන් වියදම් | 11,706,312.00 | 9,708,196.00 |
| සැපයීම් | 61,401,364.00 | 70,206,910.00 |
| නඩත්තු සේවා වියදම් | 24,503,027.00 | 83,911,225.00 |
| කොන්ත්‍රාත් සේවා | 204,976,567.00 | 252,818,668.00 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 162,465,234.00 | 187,095,588.00 |
| පර්යේෂණ හා සංවර්ධන( University township) | - | 3,605,597.00 |
| **එකතුව** | 1,554,627,788.00 | 1,940,143,767 |

## මූල්‍ය ක්‍රියාවලි විශ්ලේෂණය 2013 එක් ශිෂ්‍ය පිරිවැය අනුව ( අභ්‍යන්තර උපාධි අපේක්ෂක )

| පීඨය | මුලු වියදම රු. | 2013 වසරේ මුලු ශිෂ්‍ය සංඛ්‍යාව | ශිෂ්‍යයකු සඳහා වියදම |
|---|---|---|---|
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 383,933,707 | 1752 | 219,140 |
| මානව ශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පීඨය | 437,159,264 | 2770 | 157,819 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 411,082,605 | 1140 | 360,599 |
| කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය | 606,598,588 | 4793 | 126,559 |
| **එකතුව** | 1,838,774,164 | 10,455 | |

සටහන 01 : වියදම් ගණනය කිරීමේ දී බාහිර විභාග ඒකකය සඳහා හා පශ්චාද් උපාධි ඒකක සඳහා විමදම් සම්බන්ධ කර ගෙන නොමැත.

.

## මූලධන වියදම් විස්තර

| විෂය | 2012 රු | 2013 රු |
|---|---|---|
| **a**. වත්කම් අත්පත් කරගැනීම් | 183,894,890.00 | 139,759,020.00 |
| **b**. ගොඩනැගිලි හා වෙනත් අත්පත් කර ගැනීම | 93,813,162.00 | 99,705,085.00 |
| **c**. පුස්තකාල පොත් | 15,960,721.00 | 13,962,977.00 |
| **d**. වාහන | 8,575,000.00 | |
| **e**. Knowledge Enhancement Grant | - | 45,859,145.00 |
| **f**. වෙනත්(පුනරුත්තාපන) | - | 90,758,433.00 |
| **එකතුව** | 302,243,773.00 | 390,044,660.00 |

## මූල්‍ය කාර්යඵල විශ්ලේෂ- 2013


| විෂය | ක්‍රමය | ශිෂ්‍යයකු සඳහා වියදම |
|---|---|---|
| අ. ශිෂ්‍යයකු සඳහා පුනරාවර්තන වියදම් | මුලු අයභාර වියදම/ ශිෂ්‍ය සංඛ්‍යාව | 185,571 |
| ආ. ශිෂ්‍යයකු සඳහා මූලධන වියදම | මුලු ප්‍රාග්ධන වයදම / ශිෂ්‍ය සංඛ්‍යාව | 37,307 |

## 2013 වසර ඇතුළුව ආසන්න පස් වසර තුළ පුනරාවර්තන වියදම්

**(ගණන රු .'000ට)**


| විෂය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| 1) පිරිස් වේතන | 725,835 | 760632 | 923,550 | 1,089,575 | 1,332,798 |
| 2) ගමන් වියදම් | 4,124 | 4926 | 6,778 | 11,706 | 9,708 |
| 3)සැපයීම් | 52,228 | 68169 | 55,889 | 61,401 | 70,207 |
| 4)නඩත්තු වියදම් | 4,038 | 13537 | 18,906 | 24,503 | 83,911 |
| 5)කොන්ත්‍රාත් සේවා | 132,935 | 158329 | 184,833 | 204,976 | 252,819 |
| 6)වෙනත් | 46,728 | 90520 | 91,327 | 150,539 | 160,995 |
| 7.) පර්යේෂණ හා සංවර්ධන කටයුතු (University township) | 4,495 | 4352 | 7,220 | 11,926 | 26,101 |
| එකතුව | - | - | - | - | 3,606 |
| 4)නඩත්තු වියදම් | 970,383 | 1,100,465 | 1288,503 | 1,555,502 | 1,942,158 |

| (වටිනාකම රු.'000) | | | | | |
|---|---|---|---|---|---|
| විෂය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| මූලධන ආධාර (capital Grant) | 178,000 | 92,000 | 189,000 | 234,000 | 454,579 |
| පුනරාවර්තන ආධාර Recurrent Grant) | 861,870 | 959,990 | 1,109,447 | 1,297,868 | 1,541,846 |



## පසුගිය වසර පහ තුළ මූල්‍ය වියදම් තොරතුරු සාමාලෝචනය

| (වටිනාකම රු.'000) | | | | | |
|---|---|---|---|---|---|
| විෂය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
| මුලධන වියදම් Capital Expenditure | 251,105 | 140,640 | 230,831 | 260,848 | 390,045 |
| පුනරාවර්තන වියදම් Recurrent Expenditure | 970,383 | 1,100,465 | 1,288,503 | 1,555,502 | 1,940,145 |



## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## මූල්‍ය ප්‍රකාශන 2013

## දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | 2013.දෙසැ:31 දිනට | 2012.දෙසැ:31 දිනට ගැලපූ |
|---|---|---|
| (ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත) | | |
| | (රු) | (රු) |
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල පිරියත හා උපකරණ | 1,344,491,268 | 1,118,566,835 |
| කෙරීගෙන යන වැඩ | 134,495,102 | 124,421,560 |
| ආයෝජන | 425,465,093 | 260,727,751 |
| | **1,904,451,463** | **1,503,716,146** |
| **ජංගම වත්කම්** | | |
| ගබඩා තොගය | 47,191,045 | 48,724,952 |
| විවිධ ණයගැතියෝ සහ ලැබිය යුතු දෑ | 133,941,434 | 116,853,172 |
| සේවක ණය සහ අත්තිකාරම් | 85,713,919 | 81,480,747 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් | 105,159,524 | 90,446,161 |
| මුදල් හා මුදල් සමානයන් | 19,299,710 | 20,772,250 |
| **උප එකතුව** | **391,305,632** | **358,277,282** |
| | | |
| **වත්කම් එකතුව** | **2,295,757,095** | **1,861,993,428** |

| (ශේෂ පත්‍රය පිටු අංක 01 සිට ඉදිරියට ගෙන ආවා) | | |
|---|---|---|
| | 2013.දෙසැ:31 දිනට | 2012.දෙසැ:31 දිනට ගැලපූ |
| | (රු) | (රු) |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | |
| මූලධන ආධාර - වැයවූ | 1,310,717,599 | 1,095,887,239 |
| මූලධන ආධාර - වැයනොවූ | 2,076,843 | 725,679 |
| වෙනත් මූලධන ආධාර - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 4,743,765 | 7,584,061 |
| මූලධන ආධාර - වාහන (අය වැය එකුලේඛ - 150) | 10,870,000 | 14,555,000 |
| විශේෂ ව්‍යාපෘති - IRQUE(IDA Credit - 3781 CE) | 16,639,613 | 24,184,755 |
| උපයාගත් අරමුදල් තුලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය | 14,149,665 | 17,734,966 |
| ත්‍යාග හා පරිත්‍යාග | 51,058,921 | 41,319,880 |
| රඳවා ගත් ඉපයීම් | 109,544,186 | 89,036,853 |
| | **1,519,800,593** | **1,291,028,433** |
| | | |
| **සංචිත හා අරමුදල්** | | |
| විශේෂ සංචිත | 51,360,863 | 37,505,456 |
| මූලධන සංචිතය | 25,574,237 | 25,671,311 |
| අනුස්මරණ අරමුදල් | 26,327,642 | 17,799,656 |
| විවිධ ව්‍යාපෘති සහ පර්යේෂණ ආධාර | 39,759,748 | 34,566,276 |
| විලම්භිත ආදායම - ස්වයං මූල්‍ය හා ව්‍යාපෘති | 100,026,780 | 13,878,524 |
| | **243,049,270** | **129,421,223** |
| | | |
| **ජංගම නොවන වගකීම** | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 322,430,040 | 293,972,676 |
| | **322,430,040** | **293,972,676** |
| | | |
| **ජංගම වගකීම්** | | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 6,987,268 | 26,935,572 |
| උපචිත වියදම් | 122,551,337 | 85,080,483 |
| ගෙවිය යුතු දෑ | 80,938,588 | 35,555,042 |
| | **210,477,193** | **147,571,097** |
| | | |
| **ස්කන්ධය හා වගකීම් වල එකතුව** | **2,295,757,095** | **1,861,993,428** |
| | | |
| අත්සන් කලේ: | අත්සන් කලේ: | අත්සන් කලේ |
| ආචාර්ය එන්.එල්.ඒ.කරුණාරත්න | කේ.ජී. බ්‍රිටෝ | ඒ.අයි.එන් පැස්කුවල් |
| **උපකුලපති** | **ලේඛකාධිකාරී** | **මූල්‍යාධිකාරී** |
| 2014 ඔක්තොම්බර් මස 17 වන දින | | |

## <u>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය</u>

## <u>2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය</u>

**( ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත)**

| | 2013 | 2012 ගැලපූ |
|---|---|---|
| **<u>මෙහෙයුම් ආදායම</u>** | රු: | රු: |
| රජයේ ආධාර - පුනරාවර්තන | 1,541,846,000 | 1,297,868,000 |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 93,951,402 | 7,300,000 |
| ශ්‍රී.ල.වි.වි ක්‍රීඩා තරඟාවලිය සඳහ වි.ප්‍ර.කො අතිරේක ප්‍රතිපාදන | - | - |
| ආරක්ෂක සේවා සඳහා වි.ප්‍ර.කො අතිරේක ප්‍රතිපාදන | - | 4,000,000 |
| ශිෂ්‍යාධාර | 39,375,200 | 21,945,600 |
| මෝටර් වාහන විකුණුම් මත ලාභය | 2,007,530 | - |
| මහපොළ ශිෂ්‍යත්ව | 105,986,000 | 132,438,150 |
| අභ්‍යන්තර ආදායම් | 323,443,189 | 210,490,445 |
| රජයේ ආධාර සහ පරිත්‍යාග ක්‍රමක්ෂය | 173,116,320 | 199,887,673 |
| නිහ අර්ථසාධක දායකත්වය - ජීවන් වියදම් දීමනාව මත/ වි.ප්‍ර.කො දායකත්වය | - | 22,564,240 |
| නිහ විශ්‍රාම වැටුප් දායකත්වය - ජීවන් වියදම් දීමනාව මත/ වි.ප්‍ර.කො දායකත්වය | - | 9,510,145 |
| **මුළු ආදායම** | **2,279,725,642** | **1,906,004,253** |
| | | |
| **<u>මෙහෙයුම් වියදම්</u>** | | |
| සේවක වැටුප් හා දීමනා | 1,332,797,583 | 1,089,575,284 |
| ගමන් වියදම් | 9,708,196 | 11,706,312 |
| සැපයීම් | 70,206,910 | 61,401,364 |
| නඩත්තු සේවා | 83,911,225 | 24,503,027 |
| කොන්ත්‍රාත් සේවා | 252,818,668 | 204,976,567 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 187,095,588 | 162,465,234 |
| නගර සංවර්ධන ව්‍යාපෘතිය | 3,605,597 | - |
| ක්ෂය වීම | 173,713,342 | 270,189,981 |
| ශිෂ්‍යාධාර | 39,375,200 | 21,945,600 |
| මහපොළ ශිෂ්‍යත්ව | 105,986,000 | 132,438,150 |
| **මුළු වියදම්** | **2,259,218,308** | **1,979,201,519** |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | 2013.12.31 දිනට | 2012.12.31 දිනට ගැලපූ |
|---|---|---|
| | (රු:) | (රු:) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් (ඌනතාවය) /අතිරික්තය | 20,507,333 | (73,197,266) |
| | | |
| **ගැලපීම්** | | |
| ක්ෂය කිරීම | 173,713,342 | 270,189,981 |
| මෝටර් වාහන විකුණුම් මත ලාභය | (2,007,530) | - |
| ආයෝජන පොලී | (32,063,545) | (15,749,848) |
| විශ්‍රාම පාරිතෝෂික වෙන්කිරීම | 44,972,181 | 27,114,906 |
| ප්‍රාග්ධන ක්‍රමක්ෂය | (150,196,736) | (74,025,147) |
| වාහන ප්‍රදාන ක්‍රමක්ෂය | (3,685,000) | (3,235,833) |
| උපයාගත් අරමුදල් තුලින් ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ශාස්ත්‍ර පීඨය | (5,195,738) | (4,905,477) |
| පරිත්‍යාග ක්‍රමක්ෂය | (6,493,705) | (3,861,027) |
| IRQU ව්‍යාපෘති ක්‍රමක්ෂය | (7,545,142) | (113,860,189) |
| පෙර වර්ෂයට අදාළ වෙනත් අරමුදල් | - | 1,360,771 |
| වත්කම් කපා හැරීම | 1,748 | 25,780 |
| පුනරාවර්තන ස්වභාවයේ සේවක සංවර්ධන ප්‍රදානය | (1,589,634) | - |
| රජයේ ආධාර - මූලධන වත්කම් ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කිරීම | (93,951,402) | (7,300,000) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(63,533,828)** | **2,556,651** |
| | | |
| ගබඩා තොගය (වැඩිවීම/අඩුවීම) | 1,533,907 | (12,244,136) |
| ණයගැතියෝ සහ ලැබියයුතු දෑ (වැඩිවීම/අඩුවීම) | 2,183,955 | 17,280,053 |
| සේවක ණය හා අත්තිකාරම් (වැඩිවීම/අඩුවීම) | (4,233,172) | 2,224,448 |
| අත්තිකාරම් හා පෙර ගෙවීම් (වැඩිවීම/අඩුවීම) | (14,713,363) | 2,429,436 |
| මූලධන වෙන්කිරීම (වැඩිවීම/අඩුවීම) | (97,074) | (23,620) |
| උපචිත වියදම් (වැඩිවීම/අඩුවීම) | 37,470,854 | 19,154,477 |
| ආපසු ගෙවියයුතු තැන්පතු (වැඩිවීම/අඩුවීම) | (19,948,304) | (2,394,223) |
| ගෙවිය යුතු දෑ (වැඩිවීම/අඩුවීම) | 45,383,546 | (14,754,139) |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීමෙන් පසු ඇති වූ මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(15,953,479)** | **14,228,947** |
| පාරිතෝෂික ගෙවීම | (16,514,817) | (11,989,913) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(32,468,297)** | **2,239,034** |

| | 2013.12.31 දිනට | 2012.12.31 දිනට ගැලපූ |
|---|---|---|
| | (රු:) | (රු:) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | (318,035,536) | (79,864,315) |
| මෝටර් රථ මිළට ගැනීම් | 2,007,530 | - |
| වෙනත් ආධාර මගින් දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම | - | (106,929,552) |
| ආයෝජන පොලී | 12,791,328 | 8,089,140 |
| කෙරීගෙන යන වැඩ | (73,834,346) | (65,479,207) |
| ආයෝජන | (164,737,342) | (73,082,809) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(541,808,366)** | **(317,266,743)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ආධාර | 454,579,000 | 234,000,000 |
| තොරතුරු තාක්ෂණ ආධාර(වි.ප්‍ර.කො) - පුස්තකාලය | - | 1,000,000 |
| වෙනත් ප්‍රදාන - උසස් අධ්‍යාපන ආයතනනය - ත්‍රිත්ව භාෂා වැඩසටහන | - | 1,750,000 |
| කාර්යමණ්ඩල සංවර්ධන ක්‍රියාකාරම් | 4,500,000 | - |
| අනුස්මරණ අරමුදල් | 8,527,986 | (7,639,568) |
| විශේෂිත අරමුදල් | 13,855,407 | 26,991,346 |
| උපයාගත් අරමුදල් ආයතන්වය | - | 1,758,733 |
| පර්යේෂණ අරමුදල් | 5,193,473 | 6,268,785 |
| ව්‍යාපෘති පාඨමාලා | 86,148,256 | (34,365,807) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **572,804,124** | **229,763,490** |
| | | |
| මුදල් හා මුදල් වලට සමානයන් වලින් සිදුවූ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | (1,472,539) | (85,264,220) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් වලට සමානයන් | 20,772,250 | 106,036,470 |
| **කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් වලට සමානයන්** | **19,299,710** | **20,772,250** |

සටහන 1

| | 2013.12.31 දිනට | 2012.12.31 දිනට ගැලපූ |
|---|---|---|
| **මුදල් හා මුදල් වලට සමානයන්ගේ සංයුතිය** | | |
| **භාණ්ඩාගාර අරමුදල්** | | |
| මහජන බැංකුව ගංගොඩවිල - ගි/අ 097-1- 001- 6-2315454 (පුනරාවර්තන ආධාර) | 35,747 | 4,468 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1- 001-3-2315455 (මූලධන ආධාර) | 251,927 | 8,336 |
| මහජන බැංකුව, ආයතනික ශාඛාව - ගි/අ 004-1- 001-0-0210877 | 89,517 | 761,824 |
| මහජන බැංකුව, ගංගොඩවිල - ගි/අ 097-1- 001-9-2315457 (වෛද්‍ය පීඨය) | 609,160 | 1,867,763 |
| **උප එකතුව** | **986,351** | **2,642,391** |
| **භාණ්ඩාගාර නොවන අරමුදල්** | | |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-1- 001- 8-2315467 (පශ්චාද් උපාධි පීඨය) | 98,489 | 4,180,761 |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-1- 001- 6-2315473 (ක්‍රීඩා සරෙක්) | 1,388,034 | 1,388,034 |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-1- 001- 4-2315474 (ක්‍රීඩා සරෙක්) | 601,789 | 601,789 |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-1- 001- 8-2315472 (ශිෂ්‍ය සහන අරමුදල) | 113,198 | 121,271 |
| මහජන බැංකුව,ගංගොඩවිල -ගි/අ 097-1- 001- 1-2315456 (බාහිර විභාග ඒකකය) | 1,572,222 | 2,331,907 |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-1- 001- 7- 0000629 (50 වන සංවත්සර අරමුදල් | 91,078 | 108,220 |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-1- 001- 4- 0002229 (කළමනාකරණ පීඨ සංවර්ධන අරමුදල) | 3,149,194 | 5,302,323 |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-1- 001- 5- 0005005 (ශාස්ත්‍ර පීඨ අරමුදල) | 2,903,204 | 963,147 |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-1- 001- 4-7709343 (සංවර්ධන අරමුදල) | 3,363,548 | 3,124,416 |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-1- 001- 1-0010952 (ඩෙංගු පර්යේෂණ ආයතනය - වෛද්‍ය පීඨය) | 95,166 | - |
| මහජන බැංකුව, ගංගොඩවිල-ගි/අ 097-4- 021- 8-0010915 (විදේශ ගිණුම - වෛද්‍ය පීඨය - විදේශීය ශිෂ්‍ය ලැබීම්) | 4,934,667 | - |
| **උප එකතුව** | **18,310,589** | **18,121,869** |
| **සුළු මුදල් අග්‍රිමය** | | |
| පොදු ගිණුම | 2,750 | 7,990 |
| වෛද්‍ය පීඨ ගිණුම | 20 | - |
| **උප එකතුව** | **2,770** | **7,990** |
| මුදල් සංචිතය | - | - |
| **එකතුව** | **19,299,710** | **20,772,250** |

# 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපති වාර්තාව

73902

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

19 NOV 2014

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. — ඊසී/ඊ/පීඅයිඑම්/6/13/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date — 2014 නොවැම්බර් 16 දින |

2309
21 NOV 2014

DIA PA file 21/11/14

අධ්‍යක්ෂ,

කළමනාකරණය පිළිබඳ පශ්චාත්උපාධි ආයතනය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1985 අංක 03 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ අංක 19 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ලේඛකාධිකාරී
මුල්‍යාධිකාරී
භාර. අ. භා. ප.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

පිටපත්:
1. ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊයි/ඊ/පීඅයිඑම්/6/13/1

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 නොවැම්බර් 16 දි:

අධ්‍යක්ෂ,

කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1985 අංක 03 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ අංක 19 වගන්තිය හා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය, 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2014 මැයි 13 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල ,අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ට අනුකූලව වත්කම් සාධාරණ අගයට වාර්තා කළයුතු වුවත් දැනට භාවිතයට ගන්නා සම්පූර්ණයෙන් ක්ෂය වූ පිරිවැය රු.65,873,657ක් වටිනා ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.133,280ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයක් මිලට ගැනීමේදී ඒ සඳහා ආයතනය සතු ඡායා පිටපත් යන්ත්‍රයක් රු.20,000කට හුවමාරු කර ඇතත්, ශුද්ධ වෙනස පමණක් ගිණුම්ගත කිරීම.

(ආ) සේවකයන් වෙත විකුණා තිබූ ස්ථාවර වත්කම් අයිතම 39ක් ගිණුම් වලින් ඉවත්කිරීමට කටයුතු නොකර ලද මුදල වන රු.113,050 පමණක් ආදායම ලෙස ගිණුම්ගත කිරිම.

2.2.3 දීර්ඝකාලීනව සැසඳුම් නොකළ ශේෂ

දීර්ඝ කාලයක සිට නිරවුල් නොකරන ලද ජාත්‍යන්තර ශාඛාවෙන් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ පිළිවෙලින් රු.2,911,912 ක් හා රු.11,603,217ක් තහවුරු කර ගැනීම සඳහා උපලේඛන නොමැතිවීම හේතුවෙන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 751 හා 756 | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ලේඛණයක් පවත්වා නොතිබුණු අතර, භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තිය | විශ්වවිද්‍යාල පද්ධතියේ භාවිතා කරන වැටුප් හා දීමනා වලින් බැහැරව විවිධ ක්ෂේත්‍ර සඳහා කොන්ත්‍රාත් පදනම මත උපදේශකවරුන් 08 දෙනෙකු පත් කර තිබුණු අතර, ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව වැටුප්, දීමනා හා වැටුප් වර්ධකයන් ලබාදී තිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2013 වර්ෂය තුළ පුහුණු පාඨමාලා 08ක් පවත්වා තිබූ අතර, ඉන් 06 ක ශුද්ධ අතිරික්තය වූ රු.9,031,575ක මුදලින් රු.7,036,900ක් විධිමත් අනුමැතියකින් තොරව කාර්ය මණ්ඩලය අතර බෙදා දී තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.40,784,288 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 41,736,535 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම රු.952,247 ක් විය.

3.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

ආයතනය විසින් හිටපු අධ්‍යක්ෂ විසින් සිදු කර ඇති රු. මිලියන 50 ක පමණ වූ මූල්‍ය අක්‍රමිකතාව අය කර ගැනීම සඳහා නඩු පවරා ඇති අතර, හිටපු මූල්‍යාධිකාරී විසින් ආයතනයට විරුද්ධව රු.මිලියන 30ක වන්දි ඉල්ලා නඩු පවරා තිබුනද, මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 281ක් විය. ආයතනය පශ්චාත් උපාධි පාඨමාලා 5 කට අදාළව සිසුන් 419 දෙනෙකු වෙත 2013 වර්ෂය තුළදී උපාධි පිරිනමා තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රොපෙෂනල් මැනේජර් සහ ශ්‍රී ලංකා ජර්නල් ඔෆ් මැනේජ්මන්ට් සඟරා විකිණීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා රු.536,004 ක් වැය කර තිබුණද කිසිදු සඟරාවක් බාහිර පාර්ශවයන් විසින් මිලදී ගෙන නොතිබුණි.

(ආ) ආයතනය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.350,000 ක මුදලක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමය වෙත ප්‍රදානයක් ලෙස ලබාදී තිබුණි.

(ඇ) ආයතනයේ පවත්වාගෙන යනු ලබන කළමනාකරණ සුබසාධක සංගමය වෙත භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ අරමුදලින් රු.2,600,000 ක මුදලක් මාරු කර එම මුදලින් රු.1,964,925ක් කාර්ය මණ්ඩලය වෙත ආහාර දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඈ) 2012 වර්ෂය තුළ පුද්ගලික සමාගමක් වෙත වත්කම් කළමනාකරණය පිළිබඳ මෘදුකාංග පද්ධතියක් සකස් කරවා ගැනීම සඳහා රු.250,000 ක් ගෙවීම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අදාළ කාර්යය ඉටුකර නොතිබුණි.

4.3 හඳුනාගන්නා ලද පාඩු
-----------------------
ප්‍රකාශන තොග සම්බන්ධයෙන් විගණනයේදී සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.368,679 ක් වටිනා පොත් 547 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
-------------------
විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පරිපාලනය
(ආ) තොග පාලනය
(ඇ) පිරිස් කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති

6

# **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය හා ප්‍රකාර විගණකාධිපති වාර්තාවට 108(03) යටතේ පිළිතුරු**

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය හා ප්‍රකාර විගණකාධිපති වාර්තාවට 108(03) යටතේ පිළිතුරු සැපයීම**

ඔබගේ සාමාංක ඊසී/ඊ/යූඑස්ජේ/6/13/4 හා 2015.01.03 දරණ ඉහත සඳහන් වාර්තාව සම්බන්ධයෙන් පිළිතුරු හා ගැනීමට නියමිත ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

(අ) දැනට භාවිතයට ගන්නා සියලුම වත්කම් රාජ්‍ය තක්සේරු නිලධාරීන් විසින් ප්‍රත්‍යාගණනය කරගෙන යනු ලැබේ. මේ වන විට මෝටර් වාහන, ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සිදුකර අවසන් කර ඇති අතර 2014 වර්ෂයේ අවසන් ගිණුම් වල ගැලපීම් සිදුකරනු ලැබේ.අනෙකුත් සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. 2015 ජූනි මාසය වන විට මෙම කටයුතු අවසන් කිරීමට අපේක්ෂාකෙරේ.

(ආ) විශ්වවිද්‍යාලය සතු කොහුවල ඉඩම හා තක්සලා ගොඩනැගිල්ල දැනට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය භාවිතා කරන අතර, එම ගොඩනැගිල්ල නැවත විශ්වවිද්‍යාලයට ලබා ගැනීමට සාකච්ඡා කරමින් පවතී. මෙම ඉඩමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු බැවින් ගිණුම් වලින් ඉවත් කළ නොහැක. 2015.03.31 දිනට පෙර මෙම ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයට ආපසු භාරදෙන ලෙස සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට ලිඛිතව දැනුම් දී ඇත.

### 2.2.2 නොසැසඳුනු පාලන ගිණුම්.

පර්යේෂණ අත්තිකාරම් ගිණුමෙහි (වෛද්‍ය පීඨය) දැක්වෙන ශේෂය පෙර වර්ෂවල සිට පැවත එන ආරම්භක ශේෂයක් වන අතර එය නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ) දිගුකාලයක සිට ඉදිරියට ගෙන එන මෙම ශේෂයට අදාල අත්තිකාරම් ලබා දුන් පුද්ගලයන් සොයා ගැනීමේ අපහසුතාවයක් පවතින හෙයින් මෙම ශේෂය හඳුනා ගැනීමට නොහැකිව පවතී. මෙම ගිණුම නිරවුල් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

(ආ) 1999 වර්ෂයේදී සිදුකරනු ලැබූ මෙම කාර්යය සම්බන්ධයෙන් ලිපිගොනු සොයා ගැනීමේ අපහසුතාවයක් පවතින බැවින් අත්තිකාරම් නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පවතී. මෙම මුදල මහරගම නගර සභාවට ගෙවන ලද මුදලක් බැවින් එම ආයතනයෙන් අදාල ලිපි ලේඛන ලබා ගැනීමට උත්සාහ දරන ලද නමුත් අපොහොසත් විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

(අ) මෙම මුදල මහරගම නගර සභාවට ලබාදුන් රු.1,310,000 ක මුදල හා ඉතිරි මුදල පුස්තකාල අත්තිකාරම් ගිණුමෙහි පවතින ශේෂය වේ. පුස්තකාල අත්තිකාරම් ගිණුමේ පවතින ශේෂය 2014 අවසන් ගිණුමෙහි නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.

(ආ) මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ දිගුකාලයක සිට පැවත එන ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

(ඇ) පුස්තකාල තැන්පත්, විද්‍යාගාර තැන්පත්, ලබා නොගත් විභාග ගාස්තු යනාදී තැන්පත් මුදලින් මෙම ආපසු ගෙවිය යුතු විවිධ තැන්පතු මුදල සමන්විත වේ. අදාළ තැන්පත්කරුගේ ලිඛිත ඉල්ලීම මත මෙම මුදල් ගෙවීම සිදුකරන අතර, පාඨමාලාවන්ට අදාළ තැන්පතු අදාළ පාඨමාලා නිමවූ පසුව පමණක් ගෙවීම් කරනු ලැබේ.

(ඇ) 2013 වර්ෂයේ සංශෝධිත අවසන් ගිණුම් වල නිවැරදිව ගැලපීම් සිදුකර ඇත.

**2.4 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තිරණ වලට අනුකූල නොවීම.**

(අ)I. ගිවිසුම් හා බැඳුම්කර අත්සන් කර ඇති සේවය අතහැර ගියාසේ සලකනු ලබන ආචාර්යවරුන් සම්බන්ධයෙන් දැන්විය යුතු පාර්ශව වෙත දන්වා යැවීමට කටයුතු කර ඇත. ආයතන සංග්‍රහයේ බැඳුම්කර වටිනාකම නියම කරන ලද කාලයේදී ගෙවීමට අපොහොසත් වන්නේ නම් සති 03ක් ඇතුලත ඇපකරුවන් වෙත දැන්විය යුතු බවට සඳහන් වුවද සේවය අතහැර ගියාසේ සැලකීමෙන් පසු බැඳුම්කරයේ වටිනාකමට අමතරව විශ්වවිද්‍යාලයට ඔහුගෙන් අයවිය යුතු සියළුම අයවීම්ද ගණනය කළයුතු අතර ඒවා එක් එක් අංශවලින් ලබා ගැනීමට අවශ්‍ය බැවින් අයවිය යුතු සම්පූර්ණ වටිනාකම අදාල පුද්ගලයාට සති තුනක කාලයක් තුළදී දන්වා යැවීම ප්‍රායෝගිකව අපහසු බැව් දන්වමි.

II.2.4.අ. I පිළිතුරම අදාල වේ.

III. අධ්‍යයන කාර්යමණ්ඩල සේවකයන්ගේ පැමිණීම පිටවීම පිළිබඳව අත්සන් තැබීම විශ්වවිද්‍යාල පද්ධතියේම සිදුනොකරන බැවින් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කළ යුතුවේ.

(ආ) කථිකාචාර්ය (ආධුනික) ලෙසට ආචාර්ය මණ්ඩලයට බඳවා ගනු ලබන අයගේ තනතුරු තහවුරු කිරීමට පශ්චාද් උපාධි ලබා ගත යුතුවේ. වසර 8ක කාලයක් තුල පශ්චාද් උපාධි ලබා නොගන්නේ නම් ඔවුන්ගේ තනතුර අහිමිවේ. එහෙයින් ආචාර්යවරුන්ට පශ්චාද් උපාධි ලබාගැනීම සඳහා පාඨමාලා ගාස්තු ගෙවිය යුතු වන්නේ පරිවාස කාලය තුලදී බැවින් එසේ සිදුකර ඇති බව දන්වමි.

(ඇ) මෙම විශ්වවිද්‍යාලයේ සේවක අපනශාලාව හා සන්ථාගාර ආපනශාලාව යන ආපනශාලා දෙක, පිළිවෙලින් අනධ්‍යයන කාර්ය මණ්ඩල සුභසාධක සංගමය හා ආචාර්යවරුන්ගේ සුභසාධක සංගමය විසින් පවත්වාගෙන යන නමුත් ඒවායේ අධික්ෂණයද විශ්වවිද්‍යාල පරිපාලනය විසින් සිදුකරනු ලබයි.

(ඇ) සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කර පරිගණක මෘදුකාංග ස්ථාවර වත්කම් ලේඛණයක් පිළියෙල කරමින් පවතින බැවින්, ඉදිරියේදී එම චක්‍රලේඛණයට අනුව අදාල වත්කම් ලේඛණ ලබා ගැනීමේ හැකියාව ඇත.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

(අ) යූරෝ ලංකා නේවාසිකාගාරයේ සිසුන් 500 දෙනෙකුට පමණ නේවාසික පහසුකම් සපයා ඇති අතර යූරෝ ලංකා නේවාසිකාගාර පුද්ගලික ආයතනයේ කළමණාකාර අධ්‍යක්ෂිකා විසින් එවකට පැවති ගිවිසුම අවසාන වීමෙන් පසු තව දුරටත් ඉදිරියට නේවාසිකාගාරය අප විශ්විද්‍යාලයට ලබා දිය නොහැකි බව දන්වන ලද හෙයින් මෙම සිසුන් 500 දෙනාට නේවාසිකාගාරය ලබා දිය හැකි වෙනත් විකල්ප මාර්ගයක් විශ්විද්‍යාලය සතු නොවූ බැවින් ද, එකී කාලය අවසාන වීමට පෙර මෙම මුදල ගෙවා ගිවිසුම් කාලය මාස දෙකකින් දීර්ඝ කරගැනීමට විශ්විද්‍යාලය කටයුතු කරන ලදි.

(ආ) එදිනෙදා රාජකාරියෙන් පරිබාහිරව සිදු කරනු ලබන මෙම කාර්යය සඳහා රාජ්‍ය පරිපාලන 380 චක්‍රලේඛනයට අනුව, විශ්විද්‍යාලය මුදල් කමිටු අනුමැතියෙන් බාහිර ව්‍යාපෘති පාඨමාලා ආදායමින් මෙම ගෙවීම් සිදු කරන ලදි.

(ඇ)අධ්‍යයන නිවාඩු ලැබ විදේශ ගතව ගිවිසුම් කඩකල ආචාර්යවරුන්ගෙන් සමහරුන් බැඳුම්කර වටිනාකම එකවර ගෙවන ලද අතර සමහරුන් කොටස් වශයෙන් ගෙවනු ලැබේ. අයවිය යුතු ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර ගෙන යනු ඇත. ගිවිසුම් කඩකරන අවස්ථාව වන විට බැඳුම්කරය අත්සන් කර අවුරුදු 3ක් පමණ ගතවී ඇති බැවින් ඇපකරුවන්ගේ පදිංචි ස්ථානවල ලිපිනයන් වෙනස් වූ අවස්ථා වල නව ලිපිනයන් සොයාගැනීමේ අපහසුව නිසා ඒ අය වෙත දැන්වීමට ප්‍රමාද වන අවස්ථාද ඇත.

(ඈ) 2013 වර්ෂය සඳහා පර්යේෂණ දීමනා ලබා දීමේදී 2012 වර්ෂයේදී පර්යේෂණ යෝජනා ඉදිරිපත් කර පර්යේෂණ දීමනා ලබා ගන්නා සියළුම ආචාර්යවරුන්ගෙන් ප්‍රගති වාර්තා ලබා ගන්නා ලද අතර එම වාර්තා සඳහා පර්යේෂණ කමිටුවේ අනුමැතිය ලබාගෙන 2013 වර්ෂය සඳහා පර්යේෂණ දීමනාව ගෙවා ඇත.

(ඉ) විශ්වවිද්‍යාලය අප ජලය බැහැර කිරීමේ මූලික සැලසුම් හා භූමි පරීක්ෂණය කටයුතු කිරීම වෙනුවෙන් ජාතික ජල අපවහන හා ජල සම්පාදන මණ්ඩලයට මුදල් ගෙවා ඇතත් මහරගම, බොරලැස්ගමුව අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට ජල අපවහන හා ජල සම්පාදන මණ්ඩලය කටයුතු කරමින් පවතින බැවින් එය ආරම්භ වූ විගස විශ්වවිද්‍යාලයේ අප ජලය බැහැර කිරීමේ පද්ධතිය ද ඊට සම්බන්ධ කිරීමට නියමිත වේ.

(ඊ) ආපනශාලා ටෙන්ඩර් දෙනු ලබන්නේ වර්ෂයක කාලයකට වේ. ඉහත කාලපරිච්ඡේදයට අයත් ආපනශාලා භාරකරුවන් මේ වන විට ආපනශාලා පවත්වාගෙන යනු නොලබන බැවින් සම්පූර්ණ මුදල අයකර ගැනීමට නොහැකිව ඇති අතර රු. 125,000.00ක් තැන්පත් මුදල් වලින් අයකරගෙන ඇත. විශ්වවිද්‍යාලයේ ආපනශාලා ශුභසාධන කටයුත්තක් ලෙස සලකා පවත්වාගෙන යනු ලබන බැවින් තැන්පතු මුදල, කුලිය සහ එම කාලය තුළ ආපනශාලා භාරකරුවන්ගෙන් සිදුවන අලාභහානි අයකර ගැනීම පිළිබඳ පමණක් ගිවිසුමට ඇතුළත් කිරීම සුදුසු බවට විගණන හා කළමණාකරණ කමිටුව නිර්දේශකර පාලක සභාවට ඉදිරිපත් කර ඇත.

(උ) 2005 වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කළ අතර 2014 වර්ෂයට සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කර පරිගණක මෘදුකාංග ස්ථාවර වත්කම් ලේඛනයක් 2015 වසර තුළ පිළියෙල කර සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී.

(ඌ) යූරෝ ලංකා රෙසිඩන්සීස් නේවාසිකාගාරයෙහි ගාස්තු ප්‍රමාණය වැඩිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම පිණිස සකස් කරන ලද සංදේශය 2011.9.09 හා 2011.11.08 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එයට 2012.10.03 දිනැති ලිපිය මඟින් සිහි කැඳවීමද කර ඇති බැව් දන්වමි.

(එ) වෛද්‍ය එස්.ඩී. ජයරත්න මහතාගෙන් අයවිය යුතු මුදල රු.252,258.06 ක මුදල 2014 පෙබරවාරි මස ගෙවීමට නියමිත හිඟ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු යොදා ඇත.

වෛද්‍ය පී.ටී.ආර්.මකුලොලුව මහත්මියගේ අයවිය යුතු මුදල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අයකර ගැනීමටත්, යුද හමුදාවෙන් අයවිය යුතු කොටස ගෙන්වා ගැනීමටත් කටයුතු යොදා ඇත.

(ඒ) රු.2,201,370.00 ක් වූ අයනොවූ වාහන ආපදා හා සේවක ණය ශේෂයන්ගෙන් රු.1,523,533.00 ක ණය මුදලක් ලබා ගත් සේවකයින් දැනට වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති අතර නැවත වැටුප් ගෙවීමේදී හෝ සේවයෙන් ඉවත් වුවහොත්, අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. මීට අමතරව එම ණය මුදලින් 2013 වර්ෂයේ හා 2014 වර්ෂයේදී රු.312,603.00 අයකර ගැනීමට කටයුතු කර ඇත. රු.267,886.00 ක මුදලක් අර්ථසාධක අරමුදලින් ද රු.30,600.00 ක මුදල දැනට අයවෙමින් පවතින ණය ශේෂ වේ.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

(අ) නියමිත කාල පරිච්ඡේදය තුල පර්යේෂණ අවසන් කර වාර්තා ලබා දීමට අපොහොසත් වන ආචාර්යභවතුන්ගේ ඒවා අයකරගැනීමට කටයුතු කිරීමට නියමිත වේ.

(ආ) 2011 වර්ෂය වන විට මෙත්සෙවන ඉඩමෙන් අක්කර 5 පර්චස් 2.8 ඉඩම් කොටසක් පවරාගෙන ඇත.

**4.4 අරමුදල් ඌන උපයෝජනය.**

පවුල් සායන අරමුදල හා Ernest & Young අරමුදලෙහි ආයෝජනය නොකල මුදල ලෙස සටහන් රු.4,766,858.00 ක මුදල ඉදිරි වර්ෂයේදී සිදු කිරීමට අපේක්ෂිත විවිධ කාර්යයන් සඳහා යොදාගත යුතු බැවින්, ආයෝජනය නොකරන ලදි. රු.2,066,558.00ක් වන ඉතිරි මුදල ආයෝජන 64 කට අදාළ වන අතර 2014 වර්ෂයේදී එම මුදලද ආයෝජනයට කටයුතු යොදා ඇත.

**4.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්.**

බොරලැස්ගමුවේ පිහිටි ඉඩමෙහි ස්ථාපිත කර ඇති ගොඩනැගිලි දැනට මෙම විශ්වවිද්‍යාලයේ රියදුරු මහතුන් හතර දෙනෙකුට හා නඩත්තු, සැපයීම්, කලමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයෙහි සේවය කරනු ලබන කම්කරු මහතුන් දහතුන් දෙනෙකුට නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා භාවිතා කරනු ලබන බව දන්වමි. ඉදිරියේදී මෙය සංවර්ධනය කර ගොඩනැගිලි ඉදිකිරීමට නියමිත වේ.

**5. පද්ධති හා පාලන**

පද්ධති හා පාලන යටතේ දක්වා ඇති ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය සම්පත් අමරතුංග

උපකුලපති